# විස්මිත සෙත්කවියක හාස්කම විඳින්න සූදානම් වෙන්න...

## සතුරු කරදරද-මානසික පීඩාද

## අපහාස උපහාසද-රැකියාවේ ප්‍රතිඵල නැද්ද

## ලෙඩ රෝගද-අපල උපද්‍රවද


**භූමි ගණේ ගුරුම තුනයි - සිරිසැප දෙයි 'ම' ගණේ**
**දේව ගණේ ලඝුම තුනයි - ආයුෂ දෙයි 'න' ගණේ**
**වායු ගණේ අගට ගුරුයි - දේශයමයි 'ස' ගණේ**
**සූරි ගණේ මැදට ගුරුයි - රෝග මවයි 'ජ' ගණේ**

**මැදට ලඝුයි - දිවි මර වෙයි - අග්නි ගණේ 'ර' ගණේ**
**මුලට ලඝුයි - දියුණුම වෙයි - වාරි ගණේ 'ය' ගණේ**
**අගට ලඝුයි - විනාශ වෙයි - අහස් ගණේ 'ත' ගණේ**
**මුලට ගුරුයි - සැප පැමිණෙයි - චන්ද්‍ර ගණේ 'භ' ගණේ**

සෙත්කවි රචනය හෙවත් ඉෂ් කාව්‍ය බන්ධනයේදී ලඝු ගුරු භේදය නොසලකා පද යෙදීමත්, විරුද්ධ ගණ, සතුරු යෝනි - වේද, සතුරු අක්ෂර යෙදීමෙන් සෙත්කවියෙන් අප බලාපොරොත්තු වන්නා වූ විශ්වයේ ශුභ සන අක්ෂර නියත වශයෙන්ම අශුභ ඵල ගෙනදීමට හේතු වන බව ඔබ දන්නවාද? මෙහිදී ශබ්ද ශාස්ත්‍රීය දැනුම අවබෝධය මනා ලෙස දැන හැඳින අත්විඳ තිබීම ඉතා ශුභ ගුණ ඵල ලබාගැනීමට හේතුපාදක වන්නේය. එය ඉහත දැක්වූ පරිද්දෙන් ශුභ සන අක්ෂර යොදා ගනිමින්ම මනුෂ්‍ය වර්ගයාගේ යහපත අභිවෘද්ධිය ජීවනය ආදී මෛත්‍රී සිත මුල්කරගෙනම සෑදීම විශ්වයේ ශුභ ශක්ති ආකර්ෂණය කර සාදා ශුභ ඵල ලබාගැනීමට මනා ලෙස උපකාර වන්නේය. විරුද්ධාර්ථ, පුනරුත් - සංකාව - අපක්‍රම - ශබ්ද හීන - යතිභ්‍රෂ්ට - භින්නාදි ශාස්ත්‍ර විරෝධී දෝෂ තත්ත්වයන් ඇති නොවන්නට වගබලා ගැනීම මනා වගකීමෙන් යුතු සෙත්කවි රචකයා දැන තිබිය යුතු සුවිශේෂ කුසලතාවක් වන්නේය. මෙය සෑම දෙනාටම කළ හැකි දෙයක් නොවේ. ශාස්ත්‍රීය දැනුම අවබෝධය මෙන්ම කරුණාවන්ත මෛත්‍රීසහගත සිතුවිලි පෙරදැරිව මහත්වූ දයානුකම්පාව දෙවියන්ගෙන් ඇයද සිටීමකි. එය සෑම දෙනාටම කළ නොහැක්කේද එබැවිනි.

ඔබගේ කේන්ද්‍ර පරීක්ෂාවේදී මෙම සෙත්කවි ලිවීම සුදුසු නුසුදුසු බව ඉතා හොඳින්ම කේන්ද්‍ර පරීක්ෂා කළ පසුව තීරණය වන්නකි. එයට හේතුව වනුයේ ඔබට විසිදෙවැනි ද්‍රේකාණාධිපතිගේ මහ දශා අතුරු දශා මෙන්ම 64 වැනි නවාංශක අධිපතිගේ නීච සතුරු මහදශා, අතුරු දශා මෙන්ම බාධක මහ දශා, අන්තර් දශා ගතකරන කාලය තුළදී ලග්න ඒරාෂ්ටක, ලග්න අෂ්ටම ඒරාෂ්ටක, චන්ද්‍ර අෂ්ටම ඒරාෂ්ටක,ජන්ම ඒරාෂ්ටක සහ සඳු සිටි රාශියෙන් දෙපස ගෝචර ගමනින් සෙනසුරුගේ පැමිණීම ආදී කාලවකවානුව තුළදී ඔබට කරන නියත කටයුතු අඩපණ වීම, කායික මානසික පීඩා උත්සන්න වීම, සතුරු කරදර මතුවීම, ඔබගේ පෞරුෂ වර්ධනයට බලපෑම් එල්ල වීම, නින්දා අපහාස උපහාස, තාඩන පීඩන, මානසික ව්‍යාකූලභාවය වැඩිවී චිත්ත විපර්යාස ව්‍යාකූල තත්ත්වය වැඩිවීම මෙන්ම රැකියා අපේක්ෂිත ඔබ සිතන පතන වෙහෙස මහන්සි වන තරමේ ප්‍රතිඵල අත්විඳීමට ඔබට ඉඩකඩ නොලැබී යෑම, කරන සෑම කටයුත්තෙන්ම ප්‍රතිඵල හීන වී බලාපොරොත්තු කඩවීම් ආදී දේ සිදුවීම තුළින් ඔබ මෙසේ කේන්ද්‍රය බලාගැනීමට යොමුවන බව මම හොඳින්ම දන්නා කාරණාවක් මෙන්ම මෙය මා අත්දුටු ගැටලුකාරී තත්ත්වයන් බව මනා ලෙස තේරුම්ගත් කරුණු අතරින් එකකි. එවැනි වූ අවස්ථාවක රෝග පීඩා තත්ත්වයන්ට දැඩි ලෙස මුහුණ දෙන පිරිසද සිටිති. ඒ සෑම කරුණක්ම මනා ලෙස පරීක්ෂා කොට ඉන් අනතුරුව සෙත්කවි රචනය කළ යුතුය. පිහිටක් විය යුතුම තැන පිහිට පිළිසරණ සහනය සුවය උදෙසාම එම කේන්ද්‍ර පරීක්ෂාවෙන් අනතුරුව ඉල්ලීම අදාළ කාරණාව මනා ලෙස අවබෝධ කරගත් පසුව දෙවියන් උදෙසා තම ඉල්ලීම යොමුකිරීම ආරම්භ කරනු ඇත.

මේ ආදී සියලු කරුණු මනා ලෙස ගළපා ඉන් අනතුරුව එහි පිහිට පතන්නාගේ මතු දියුණුව අභිවෘද්ධිය උදාවීම පිණිස දෙවියන්ට බොහෝ ගෞරව භක්තිය පෙරදැරි කරගෙන මනා විශ්වාසයෙන් ඒ ගැන කටයුතු කිරීම පිහිට පතන්නාට වඩාත් යහපතට ළංවීමට පාර කපන විශිෂ්ට මාර්ගයක් වනු ඇත. ඒ අනුව සෙත්කවියක නියමිත තැන්හි සුදුසු ගණයන්ට අනුව පද යෙදීමෙන් හෝ නොයෙදීමෙන් පමණක් ඇතිවන්නා වූ ඵලයන් අපලයන් මුලින්ම මා සඳහන් කළේ ඒ පිළිබඳ සෙත්කවි රචකයා මෙන්ම සෙත්කවියේ පිහිට පතන්නාටද එම සෙත්කවිය නිවැරැදිව සැකසූ පසු සෙත්කවි කියවන්නාද නිවැරැදි සන අනුව උච්චාරණය කිරීම සිදුකිරීම මෙහි ඇති විශේෂ ගුණ මහිමය අත්වඳීමට ඒකාන්ත වශයෙන්ම හේතුවන බැවින්ය. එබැවින් ඒ ගැන ඔබ ඔබගේ විශේෂ අවධානය යොමුකළ යුතුවේ. එයට හේතුව ලෙස මා මෙහි සටහන් කරන්නේ පණ පිහිටුවා ලියන ලද සෙත්කවියේ බලයත්, නිසි ඵලයත් ප්‍රශස්ත කරගත යුතු බැවිනි. එම නිසා කාව්‍ය රචනයේදී කාව්‍ය නිර්මාණයේදී දසවිධ ප්‍රාණයන් ගැන සැලකිලිමත් වීම වැදගත් වන්නේ එහෙයින් බව ඔබ දතයුතුව ඇත. ඉතා සරල වචන යොදා ගන්නා අතරම, භාෂා දැනුම මෙහිදී ඉතා බලවත් වනු ඇත. දෙවියන්ගේ





ගුණ සමුදායත්, තමාගේ පැතුමත් ඉතා හොඳින් පිහිට පතන්නාගේ සිතෙහි කාවැදීම තුළින් උපදවා ගන්නා වූ නිරවුල් වූ මනසින් පවිත්‍ර හැඟීම හේතුකොටගෙන පිහිට පතන්නාගේ අපේක්ෂිත ශුභ ඵලය වඩාත් තහවුරු වීමක් මෙහිදී සිදුවනු ඇත.

මෙහිදී කාව්‍ය නායකයාගේ නම දෙපසද පිහිට පතන දෙවියන්ගේ නම දෙපසද සෙත් කවියේ මුල් ගණ 3 හා 7 වැනි ගණයද කවියෙහි 4 වැනි පාදයේ අවසන් ගණයද මාත්‍රා-ස්වර-අක්ෂර-ගණ-යෝනි ආදී සෑම අතකින්ම නිසි පරිදිම ශාස්ත්‍රානුකූලවම ශබ්ද ශාස්ත්‍රයට අනුගතවද සීහුම් චක්‍රයට අනුවද නිසි පරිදි සීහුම් කළ යුතුව ඇත. තවද මෙහිදී කාව්‍ය නායකයාටද සෙත්කවි කාව්‍ය රචකයාටද සීහුම් වන දින හා නැකැත්ම යොදාග ැනීම වඩාත් ශුභ කාව්‍ය නිර්මාණයක අනිවාර්යයෙන්ම තිබිය යුතු කරුණු කාරණා වේ.

එමෙන්ම සෙත්කවියක බලය හා ඵලය ගැන විමසීමේදී කවියේ මූලාරම්භක අක්ෂරයන් ගණයන් ඉතා වැදගත් වනු ඇත. අභිධානයට හා පංච මහා භූත චක්‍රයටත්, අ-ම-ත-ල චක්‍රය ඇතුළු සීහුම් චක්‍රයටත් ඉතාම ගැළපෙන අක්ෂරයක් තෝරාගැනීමත් ඉතා ශුභ ගණයක් මුල් පදයේ ආරම්භක අවස්ථාවට යොදාගැනීමත් අනිවාර්යයෙන්ම සිදුකළ යුතු බව ඔබ දන්නවාද?

ඔබට ඇති අවහිරතා බාධක දුක් කම්කටොලු ජය ගෙන අපල උපද්‍රව ජීවිතයට ආශීර්වාදයක් කරගන්න ඔබ කෙතරම් දුරට දක්ෂ විය යුතුද යන්න ඔබ විසින්ම තේරුම් බේරුම් කරගැනීමට සුදුසු කාලය ඔබට එළඹෙනු නියතය. ඔබත් සූදානම් වී සිටින්න. 'විස්මිත සෙත්කවියක හාස්කම' අත්විඳ, බාධා ජයගැනීමට විශ්වයේ යහපත් ශක්තීන්ගේ යහපත් වූ ආශීර්වාදය ඔබ සැමට උදාකර ගැනීමට හැකිවනු ඇත. තුනුරුවනේ අනන්ත වූ ගුණ බලයෙන් සියලු යහපත උදාවේවා... මෙවන් වූ ලිපි පෙළකින් ඔබේ දැනුම බුද්ධිය අභිවෘද්ධිය සලසා දීමට අප සූදානමින් සිටිමු. ඔබත් සූදනම් වී සිටින්න.

**ජ්‍යොතිර්වේදිනී පී.එම්. සංජීවී වසන්ති**



*ජ්‍යොතිර් විද්‍යා ඩිප්ලෝමාධාරිනී / ජ්‍යොතිෂ ශිරෝමනී, ජ්‍යොතිෂ අවිශ්කාර් විශිෂ්ට ගෞරව සම්මානලාභිනී, සෙත්කවි ශාස්ත්‍ර විශාරද විශිෂ්ට ගෞරව සම්මානලාභිනී*
*සංජීවී ජ්‍යොතිර් පියස*
*දුරකතන - 0777 130391*

---

# ඇවිල්ලා මාසයයි තලපති ඉවරයි

**තමිල්නාඩු දේශපාලනයේ විශාලතම විපර්යාසයක් සිදුකරමින් සුපිරි සිනමා තරුව ජෝසෆ් විජේ ප්‍රධාන අමාත්‍ය ධුරයට පත්වූ අවස්ථාවේ සිටම දකුණු ඉන්දියාව පමණක් නොව සමස්ත ඉන්දිය දේශපාලන ක්ෂේත්‍රයේම අවධානය ඔහු වෙත යොමුවී තිබේ.**

දශක තුනකට අධික කාලයක් තිරයේ වීරයා වූ ඔහු, දැන් සැබෑ ජීවිතයේ දේශපාලන නායකයකු ලෙස ජනතා අපේක්ෂාවන්ට මුහුණ දෙමින් සිටී. විජයගේ පාලනයට තවමත් ඉතා කෙටි කාලයක් ගතවී තිබුණද, එම කාලය තුළ ගත් තීරණ සහ පෙන්වා ඇති නායකත්ව ශෛලිය පිළිබඳ මේ වනවිටත් විවිධ අදහස් පළවෙමින් පවතී.

## 'චිත්‍රපට වීරයෙක්' නොව 'පරිපාලකයෙක්' වීමට උත්සාහයක්

බොහෝ දෙනා බලාපොරොත්තු වූයේ ජනප්‍රිය චරිතයකට සාමාන්‍යයෙන් එල්ල වන ප්‍රචාරණාත්මක දේශපාලනයකි. එහෙත් විජයගේ මුල් ක්‍රියාකාරකම් දෙස බලන විට ඔහු තම ප්‍රතිරූපය ජනප්‍රියත්වයෙන් පමණක් නොව පරිපාලන කාර්යක්ෂමතාවයෙන්ද ගොඩනගා ගැනීමට උත්සාහ කරන බවක් පෙනේ.

ධුරයට පත්වූ වහාම රාජ්‍ය ව්‍යාපෘති සිය ගණනක් සමාලෝචනය කිරීමටත්, නිලධාරීන් සමග දිගු සාකච්ඡා පැවැත්වීමටත් ඔහු කටයුතු කළේය. ජනතාව ඉදිරියේ දේශපාලන කතා පමණක් නොව, නිලධාරීන් ඉදිරියේ ප්‍රගති වාර්තා ඉල්ලා සිටින නායකයකු ලෙස ඔහු පෙනීසිටීමට උත්සාහ දරන බව දේශපාලන විචාරකයන්ගේ අදහසයි.

## දූෂණයට එරෙහිව දැඩි පණිවුඩයක්

විජේගේ ආණ්ඩුවේ මුල් දිනවල වැඩිම ප්‍රසිද්ධියක් ලැබූ ක්ෂේත්‍රය වූයේ දූෂණ විරෝධී වැඩපිළිවෙළයි. විශේෂයෙන් TASMAC මත්පැන් අලෙවි ජාලය සම්බන්ධයෙන් මතුවූ චෝදනා පිළිබඳ දැඩි අවධානයක් යොමුකිරීමට ඔහු කටයුතු කළේය. වසර ගණනාවක් තිස්සේ දේශපාලනික බලපෑම්, අවිධිමත් මුදල් එකතු කිරීම් සහ ආදායම් කාන්දුවීම් පිළිබඳ චෝදනා එල්ල වූ මෙම පද්ධතිය සම්පූර්ණයෙන් සමාලෝචනය කිරීමට පියවර ගෙන තිබේ.

තම පක්ෂයේ සාමාජිකයන්ට පවා රාජ්‍ය කොන්ත්‍රාත්, ටෙන්ඩර් සහ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් මැදිහත් නොවන ලෙස උපදෙස් දී ඇති බව වාර්තා වීම ඔහුගේ පාලනයේ වැදගත් සංඥාවක් ලෙස සැලකේ. කෙසේ වෙතත් දේශපාලන විශ්ලේෂකයන් පෙන්වා දෙන්නේ දූෂණ විරෝධී සටනක සාර්ථකත්වය මැනෙන්නේ නිවේදනවලින් නොව නඩු, දඬුවම් සහ ආයතනික ප්‍රතිසංස්කරණවලින් බවයි.

## සංවර්ධනය සහ ආයෝජන

විජේ ආණ්ඩුව ආයෝජන ආකර්ෂණයටද විශේෂ අවධානයක් යොමුකර තිබේ. විශාල වටිනාකමකින් යුත් කර්මාන්ත හා යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් සාකච්ඡා සහ ගිවිසුම් ඇතිකර ගැනීම මගින් රැකියා අවස්ථා සහ ආර්ථික වර්ධනය ඉලක්ක කරගෙන යන බව පෙනේ.

තමිල්නාඩුව ඉන්දියාවේ කර්මාන්තික බළකොටුවක් බවට පත්කිරීමේ අරමුණින් නව ආයෝජන ආකර්ෂණය කිරීම ඔහුගේ ආණ්ඩුවේ ප්‍රධාන ඉලක්කයක් බව නිල ප්‍රකාශවලින් පැහැදිලි වේ.

## ජලය, නගර සංවර්ධනය සහ පරිසරය

විජේගේ පාලනයේ තවත් කැපීපෙනෙන අංශයක් වන්නේ නාගරික ජල සැපයුම සහ පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් දැක්වූ උනන්දුවයි. වසර ගණනාවක් තිස්සේ දූෂණයට හා නොසලකා හැරීමට ලක්වූ කූම් ගඟ සහ බකිංහැම් ඇළ ප්‍රතිසංස්කරණය කිරීමේ සැලසුම් ඔහුගේ පාලනයේ ප්‍රමුඛතා අතරට පැමිණ ඇත. මේවා සාර්ථක වුවහොත්, එය විජයගේ පාලනයේ දිගුකාලීන සලකුණක් බවට පත්විය හැකිය.

## අමාත්‍ය මණ්ඩලය: අත්දැකීම් සහ තාරුණ්‍යය අතර

විජයගේ අමාත්‍ය මණ්ඩලය දෙස බලන විට එය පැරණි දේශපාලන අත්දැකීම් සහ නව පරපුරේ දේශපාලන ශක්තිය අතර සම්මිශ්‍රණයක් ලෙස දැකිය හැකිය. එහෙත් බොහෝ අමාත්‍යවරුන්ට විශාල රාජ්‍ය ආයතන කළමනාකරණයේ සෘජු අත්දැකීම් නොමැති බව විවේචකයෝ පෙන්වා දෙති. එබැවින් අමාත්‍ය මණ්ඩලයේ සැබෑ හැකියාව තීරණය වන්නේ ඉදිරි මාස කිහිපයේදී ඔවුන්ගේ කාර්යසාධනය මතය.

## 'සරල මිනිසා'ගේ ප්‍රතිරූපය

විජේගේ විශේෂත්වය වන්නේ බලයට පත්වීමෙන් පසුවද ඔහුගේ පුද්ගලික ප්‍රතිරූපය විශාල ලෙස වෙනස් නොවීමයි. විශාල ආරක්ෂක වළලු, අධික ප්‍රදර්ශනය හෝ අතිශය සුඛෝපභෝගී ජීවන රටාවක් ප්‍රදර්ශනය කිරීම වෙනුවට, ඔහු තවමත් සාමාන්‍ය ජනතාවට සමීප නායකයකු ලෙස පෙනීසිටීමට උත්සාහ දරයි.

සුදු කමිසය, වේට්ටිය සහ සරල පෙනුම ඔහුගේ දේශපාලන සන්නාමයේ කොටසක් බවට පත්ව ඇත. දේශපාලන විචාරකයන් පෙන්වා දෙන්නේ එම්.ජී.ආර්., ජයලලිතා සහ කරුණානිධි වැනි තමිල්නාඩු නායකයන්ගේ පසුබිම තුළ ජනතාව සමග සෘජු සම්බන්ධතාවයක් පවත්වා ගැනීම විජයගේ ප්‍රධාන ශක්තියක් විය හැකි බවයි.

## විජය ඉදිරියේ ඇති විශාලම අභියෝගය

කෙසේ වෙතත් ජනප්‍රියත්වය සහ හොඳ ප්‍රතිරූපයක් පමණක් ආණ්ඩුවක් සාර්ථක කරන්නේ නැත. විජයගේ ඉදිරි මාස 12 තීරණාත්මක වනු ඇත.

**ඔහුට මුහුණ දීමට සිදුවන්නේ,**

- ආර්ථික පීඩනය
- රැකියා අවස්ථා වැඩි කිරීම
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය
- දූෂණ විරෝධී සටනේ ප්‍රතිඵල පෙන්වීම
- පක්ෂ අභ්‍යන්තර පාලනය
- සන්ධාන දේශපාලනය
- ජනතා අපේක්ෂා කළමනාකරණය යන අභියෝග රැසකටය.

## අවසාන තක්සේරුව

අද වනවිට විජේගේ පාලනය පිළිබඳ කෙටි සාරාංශයක් ලබාදිය යුතු නම් එය මෙසේ විය හැකිය.

'හොඳ ආරම්භයක් ගෙන ඇති, දූෂණයට එරෙහි පණිවුඩයක් ලබාදී ඇති, සරල ප්‍රතිරූපයක් පවත්වාගෙන යන නමුත් තවමත් තම පාලන හැකියාව සම්පූර්ණයෙන් ඔප්පු කළ යුතු ආණ්ඩුවක්.'

සිනමා තිරයේ වීරයා ලෙස ඔහු දැනටමත් ඉතිහාසගත වී ඇත. දැන් ඉතිරිව ඇත්තේ තමිල්නාඩුවේ සාර්ථක ප්‍රධාන අමාත්‍යවරයකු ලෙසද ඉතිහාසයේ ස්ථානයක් දිනාගැනීම පමණි.

මාකස් ප්‍රනාන්දුපුල්ලේ







## 2014 දී පාප්වහන්සේට ලංකාවට එන්න ආරාධනා කළේ ගෝඨා

# පාප්වහන්සේ මේපාර එද්දි ගෝඨා ඇතුළේ ඉඳීද?

**2014 ඔක්තෝබර් මාසයේ එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ ෆ්‍රැන්සිස් පාප්වහන්සේ හමුවීමට ගොස් ඔහුට ලංකාවේ සංචාරයක් සඳහා ආරාධනා කළේය. ඊට පෙර 2013දී මහින්ද ලිඛිතව පාප්වහන්සේට ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කරමින් ලිපියක් ලිව්වේය. මහින්දට අවශ්‍ය වූයේ 2014 ජනාධිපතිවරණය කැඳවීමට පෙර පාප්වහන්සේව ලංකාවට ගෙන්වා ගැනීමය. පාප්වහන්සේව ලංකාවට ගෙන්වා ගැනීමේ මහින්දගේ උත්සාහය සාර්ථක කරගැනීමට ලංකාව සහ වතිකානුව අතර සම්බන්ධීකරණය කළේ කාදිනල් මැල්කම් රංජිත් හිමිය. කෙසේ හෝ ජනාධිපතිවරණයට කලින් නැත්නම් ජනාධිපතිවරණය අතරතුර පාප්වහන්සේව ගෙන්වා ගැනීම මහින්දගේ ඉලක්කය විය. එහෙත් පාප්වහන්සේට ලංකාවට නොයන ලෙස මානව හිමිකම් සංවිධාන බලපෑම් කළේ මහින්දගේ ආණ්ඩුවට එරෙහිව එල්ල වී තිබූ යුද අපරාධ නිසාය. මේ විරෝධය යටපත් කොට මහින්දගේ ආරාධනාව පිළිග ැනීමට පාප්වහන්සේ එකඟ කරගැනීමට කාදිනල් හිමි විශාල කාර්යභාරයක් කළේය. හරියටම ජනාධිපතිවරණයට වසරක් තියා එවක ආරක්ෂක ලේකම් ගෝඨාභය පාප්වහන්සේව හමුවීමට ගියේ පාප්වහන්සේගේ පැමිණීම සහතික කරගැනීමටය. පාප්වහන්සේ ආරක්ෂක ලේකම්වරයෙක් හමුවීම මානව හිමිකම් සංවිධානවල විවේචනයට ලක්වුණත් ඒ හමුවීම පවා සම්බන්ධීකරණය කළේ කාදිනල් මැල්කම් රංජිත් හිමියන්ය.**

පාප්වහන්සේ ලංකාවට ඒමට කැමැත්ත පළ කළත් මහින්ද ජනාධිපතිවරණයක් කැඳවන මොහොතේ ලංකාවේ සංචාරය කිරීමට එකඟ වූයේ නැත. ජනාධිපතිවරණයට පසුව ලංකාවේ සංචාරය කිරීමට ඔහු කැමැත්ත පළ කළේය. පාප්වහන්සේ ලංකාවට එන විට මහින්ද පරාජය වී නව ජනාධිපතිවරයෙක් පත්වී තිබිණි.

පසුගියදා ජනාධිපති අනුර නව පාප්වහන්සේ ලියෝට ලංකාවේ සංචාරය කරන ලෙස ආරාධනා කළේය. ඔහුගේ නිල ආරාධනය පාප්වහන්සේට භාරදුන්නේ බිමල් රත්නායක ඇමැතිවරයාය. පසුගිය මාර්තු මාසයේ ඔහු වතිකානුවට ගොස් ආරාධනය භාරදුන්නේය. පාප්වහන්සේගේ සංචාරය සඳහා ආණ්ඩුව සහ වතිකානුව අතර සම්බන්ධීකරණය කරන්නේත් කාදිනල් හිමිය.

අනුරගේ සහ කාදිනල් හිමිගේ අරමුණ පාප්වහන්සේගේ සංචාරයට පෙර පාස්කු ප්‍රහාරයේ විමර්ශන අවසන් කිරීමය. වතිකානු ආරංචි මාර්ග කියන්නේ ආණ්ඩුව ඒ පොරොන්දුව වතිකානුවට දී ඇති බවය. කාදිනල් හිමි ඒ සඳහා ආණ්ඩුවට බලපෑම් කරන බව පැහැදිලිය. මේ විමර්ශනවල ප්‍රතිඵලයක් ලෙස පසුගියදා අධිකරණය ගෝඨාභයට විදේශ ගමන් තහනමක් පැනවීය. 2013 කාදිනල් හිමිගේ සම්බන්ධීකරණයෙන් ෆ්‍රැන්සිස් පාප්වහන්සේව ලංකාවට ගෙන්වා ගැනීමට ආරාධනා කළ ගෝඨාභය මෙදා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සිදුවන විමර්ශනවලදී චූදිතයෙක් බවට පත්වීම දෛවෝපගත සිද්ධියකි. පාප්වහන්සේ ලංකාවට පැමිණෙන විට ගෝඨාභයට පාස්කු ප්‍රහාර චෝදනා එල්ල කොට ඔහුව අත්අඩංගුවට ගැනීමට ආණ්ඩුව ක්‍රියා කරනවාදැයි පැහැදිලි නැත.









# තුන් මුල්ලක හිරවුණු විමල් බිත්ති හතරකට කො

**දේශපාලන කරළියේ ඇතැම් චරිත කුණාටු මැදින් නැගී සිටිති. තවත් සමහරු කුණාටු තමන් විසින්ම නිර්මාණය කරති. එහෙත්, මේ මොහොත වනවිට ශ්‍රී ලාංකේය දේශපාලනයේ රැඩිකල් සහ ආවේගශීලී දේශපාලන ප්‍රකාශනයක් ලෙස කැපීපෙනුණු විමල් වීරවංශ මුහුණදී සිටින්නේ තමන් විසින් නිර්මාණය කරන ලද හෝ තමන් වෙත හමා ආ දරුණුතම නෛතික සහ දේශපාලනික සුළි සුළඟකටය. එය හුදෙක් තනි පුද්ගලයකු වටා කැරකෙන නඩු විභාග මාලාවක් පමණක් නොව, දශක කිහිපයක් තිස්සේ මෙරට ජාතිකවාදී දේශපාලනයේ මෙහෙයුම් මැදිරියක් බඳුවූ පවුලක් සහ වටපිටාවක් එකවර දෙදරා යාමකි. බැලූ බැල්මට මේ සියල්ල අහම්බයන් සේ පෙනුණද, නීතියේ සහ දේශපාලනයේ සියුම් නූල් පටවල් එකිනෙක ගැටගැසෙමින් පවතින්නේ විමල් වීරවංශ නම් දේශපාලන සන්නාමය දරුණුතම කඩාවැටීමකට හෝ තීරණාත්මක පරිවර්තනයකට ලක් කරමිනි. කලක් වේදිකාවෙන් වේදිකාවට සිංහ නාද කළ, රාජ්‍ය බලයේ පංගුකාරයන් තීරණය කළ ඒ දේශපාලන බලකණුව අද වනවිට අධිකරණ සංකීර්ණවල ලේඛන ගොනු සහ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මැද හුදෙකලා වෙමින් පවතී.**

මෙම නෛතික කුණාටුවේ පළමු සහ දරුණුතම ප්‍රහාරය එල්ල වූයේ ඔහුගේ පවුලේ අභ්‍යන්තරයටමය. විමල් වීරවංශගේ දේශපාලන ගමන පිටුපස දැවැන්ත සෙවණැල්ලක් වූ ඔහුගේ බිරිඳ, ශෂී වීරවංශ ව්‍යාජ තොරතුරු ඇතුළත් කර විදේශ ගමන් බලපත්‍රයක් ලබාගැනීමේ චෝදනාවට වරදකාරිය වෙමින් බන්ධනාගාරගත වීමට නියම වීම මෙම නාට්‍යයේ පළමු තීරණාත්මක හැරවුම් ලක්ෂ්‍යය විය. කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය ඇයට වසර දෙකක බරපතළ වැඩ සහිත සිරදඬුවම් නියම කිරීමත් සමග වීරවංශ සතු වූ 'දේශපාලන ප්‍රතිශක්තිය' බිඳවැටීමේ පළමු සංඥාව සමාජගත විය. වත්මනෙහි ඇය මහාධිකරණය වෙත ඉදිරිපත් කළ ඇපෑලද කුණු කූඩයට විසිව මහෙස්ත්‍රාත් අධිකරණය මගින් දුන් තීන්දුව තහවුරු වී වසර 2ක සිර දඬුවම් නියම වී තිබේ.

බිරිඳ මුහුණ දුන් මෙම නෛතික කැලඹීම නිමවන්නටත් මත්තෙන්, ඊළඟ ප්‍රහාරය එල්ල වූයේ ඔහුගේ සමීපතම දේශපාලන සගයන් සහ විශ්වාසවන්තයන් වෙතය. වීරවංශගේ හිටපු මාධ්‍ය ලේකම්වරයා මෙන්ම ඔහුගේ මාධ්‍ය ජාලයන් මෙහෙයවූ සමීපතමයන් නීතියේ රැහැනට හසුව රිමාන්ඩ් බන්ධනාගාරගත කිරීම එම දාමයේ තවත් එක් සුවිශේෂ පුරුකකි. දේශපාලනඥයකුගේ රහස්, උපක්‍රම සහ සමීපතම රාජ්‍ය නොවන ගනුදෙනු පිළිබඳ මැනැවින් දන්නා, ඔහුගේ හඬ සහ පැන හැසිරවූ මාධ්‍ය මෙහෙයුම්කරුවන් මෙලෙස කොටුවීම යනු විමල් වීරවංශ වටා තිබූ ආරක්ෂිත වළල්ල සහමුලින්ම දියවී ගොස් ඇති බවට දෙන ලද පැහැදිලි





# වෙසක් පෝදා ගල් විහාරයේ හීල් දානය මහජන බැංකුවෙන්

වෙසක් පොහොය දින පොළොන්නරුව ගල් විහාර පුදබිමේ සිල් සමාදන් වූ උවසු උවැසියන්ට උදෑසන හීල් දානය පිරිනැමීමට මහජන බැංකුවේ පොළොන්නරුව ප්‍රාදේශිකයේ කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදී.

මේ අවස්ථාවට කතානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් සුජන්ත ඒකනායක, මහජන බැංකුවේ සහකාර සාමාන්‍යාධිකාරිනී (කලාප ණය 4) කේ.ඒ.එස්. පීරිස්, පොළොන්නරුව ප්‍රාදේශීය කළමනාකාර එස්.එම්.ඒ.පී.කේ. සමරකෝන් යන මහත්ම මහත්මීන් ද, සහකාර ප්‍රාදේශීය කළමනාකාර මහත්මීන්, රාජ්‍ය නිලධාරීන්, මහජන බැංකු පොළොන්නරුව ප්‍රාදේශීය බෞද්ධ සංගමයේ සාමාජික සාමාජිකාවන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයෝද සහභාගි වූහ.





# මහීන්ද්‍රා අයිඩියල් පාසල් ඇතුළට

## කාර්මික අංශය අරන් එයි - එන්ජිමකුත් භාරදෙයි

ශ්‍රී ලංකාවේ රථ වාහන ක්ෂේත්‍රයේ දැවැන්තම සන්නාමයක් වන අයිඩියල් මෝටර්ස් සමාගම විසින් සමාජ සත්කාර අතින් ඉහළින්ම සිදුකරනු ලබන අයිඩියල් අභියෝගය 10 වැනි අදියර පසුගියදා හබරණ මහා විද්‍යාලය කේන්ද්‍ර කරගනිමින් අතිසාර්ථකව පැවැත්විණි.

අයිඩියල් අභියෝගය වැඩසටහන තුළ පාසල් පදනම් වූ කාර්මික පුහුණු වැඩසටහන් අවසානයේ පාසලේ කාර්මික අංශය වෙනුවෙන් මහීන්ද්‍රා එන්ජිමක් සහ කාර්මික උපකරණ පරිත්‍යාගයද සිදුවිය.

එසේම ideal singing challenge වැඩසටහන තුළදී කැකිරාව සහ හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාප තුළ පාසල් තුළින් ගීත ගායනයට දක්ෂ දරුවන් සොයා දක්ෂතම දරුවෙකු වෙත අනාගත අවස්ථාව නිර්මාණය කරදීමත් සිදුවිය.

මහීන්ද්‍රා බොලෙරෝ පාරිභෝගිකයන් සඳහා වෙන්වූ මහීන්ද්‍රා බොලෙරෝ off Road තරගය කාගේත් සිත්ගත් අංගයක් විය. වැඩසටහන් සියල්ල අවසානයේ නොමිලේ පැවැත්වූ සංගීත ප්‍රසංගය සඳහා අතිමහත් ජන ගඟක් සහභාගි වූ අතර, එයින්ම මෙම වැඩසටහනේ සාර්ථකත්වය සනාථ විය.

පීටර්සන් සොලියුෂන්ස් ශ්‍රී ලංකා ආයතනය 2026 ජූනි මස 05 වැනි දින කොළඹ ඔරියන් සිටිහි පිහිටි සිය නව ආයතනික කාර්යාලය නිල වශයෙන් විවෘත කළ අතර, එය සමාගමේ වර්ධන ගමනේ වැදගත් සන්ධිස්ථානයක් මෙන්ම ශ්‍රී ලංකාව, ආසියානු කලාපය සහ ජාත්‍යන්තර වශයෙන් ව්‍යාපාරික ප්‍රජාවට දිගුකාලීනව සහාය ලබාදීමේ කැපවීම තවදුරටත් තහවුරු කළ අවස්ථාවක් විය.

මෙම විවෘත කිරීමේ උත්සවයට රාජ්‍ය තාන්ත්‍රික සහ සංවර්ධන ක්ෂේත්‍ර නියෝජිතයන් ඇතුළු විශේෂ ආරාධිතයන් රැසක් සහභාගි වූ අතර, ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත රාජධානියේ තානාපති කාර්යාලයේ නියෝජ්‍ය ප්‍රධානියා සහ වැඩබලන තානාපතිවරයා වන ඉවාන් රට්ජන්ස් මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට එක්විය. එමෙන්ම යුරෝපා සංගමය, එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO), Market Development Facility (MDF) Australia ඇතුළු සංවිධානවල නියෝජිතයන්ද, කර්මාන්ත හවුල්කරුවන්, සේවාදායකයන් සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන්ද මෙම අවස්ථාවට සහභාගි වූහ.

විශ්වාසනීයත්වය, තාක්ෂණික විශේෂඥතාව සහ ප්‍රායෝගික ව්‍යාපාරික විසඳුම් මත ගොඩනැගුණු පීටර්සන් සොලියුෂන්ස් සමාගම, තිරසාරභාවය, අනුකූලතාවය,



# පීටර්සන් සොලියුෂන්ස් ඔරියන් සිටියට එයි

සැපයුම් දාම කළමනාකරණය, සහතිකකරණය, කෘෂිකාර්මික සංවර්ධනය සහ තාක්ෂණික නවෝත්පාදන සම්බන්ධ අභියෝග ජයගැනීම සඳහා ආයතනවලට අවශ්‍ය සහාය ලබාදෙමින් කීර්තිමත් නාමයක් දිනාගෙන ඇති සමාගමකි.

# DFCC බැංකුවට FITIS පූර්ණ සාමාජිකත්වය

## BUSINESS TALK




**මෙරට වේගයෙන්ම විකාශනය වන තාක්ෂණික පද්ධතිය සමග වඩාත් සමීපව කටයුතු කිරීමේ සහ බැංකුවේ ඩිජිටල් හැකියාවන් වර්ධනය කිරීමේ අරමුණින්, 2026 වසර සඳහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනයේ (FITIS) පූර්ණ සාමාජිකත්වය දිනාගැනීමට DFCC බැංකුව සමත් වී තිබේ.**

**ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනය වන FITIS, තාක්ෂණික සේවා සපයන්නන්, නියාමකයන් සහ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් එක් කරමින් මෙරට ඩිජිටල් සංවර්ධනයේ දිශානතිය තීරණය කිරීමෙහිලා සුවිශේෂ කාර්යභාරයක් ඉටුකරයි. ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීමට සහ බැංකු මෙහෙයුම් සරල කිරීමට ඩිජිටල් තාක්ෂණය අත්‍යාවශ්‍ය සාධකයක් වී ඇති වර්තමානයක, මෙම තාක්ෂණික පද්ධතිය සමග සක්‍රියව සම්බන්ධ වීමට DFCC බැංකුව ගත් මෙම**




**තීරණය ඉතා වැදගත් පියවරකි.**

**DFCC බැංකුව සඳහා ඩිජිටල් පරිවර්තනය යනු හුදෙක් එක් ව්‍යාපෘතියක් පමණක් නොව, එය බැංකුවේ සමස්ත මෙහෙයුම් ක්‍රියාවලිය තුළටම මුහු කළ අංගයකි. සේවාවන් ලබාගැනීමේ සිට ගනුදෙනු සැකසීම සහ තීරණ ගැනීම දක්වා වූ සියලු අංශයන් මෙමගින් ආවරණය වේ. බැංකුවේ මූලික ඉලක්කය වන්නේ සේවා සැපයීමේදී ඇතිවන බාධා අවම කරමින්, වඩාත් කාර්යක්ෂම සහ ගනුදෙනුකාර-කේන්ද්‍රීය බැංකු අත්දැකීමක් ලබාදීමයි.**

# ඉන්දීය තරු පිරිවරා HOME LANDS නිවාස ව්‍යාපෘතිය පෝට් සිටියට එනවා




## THE GRAND LAUNCH WEEKEND සිනමන් ලයිෆ් හිදී

සුපිරි බොලිවුඩ් තරු සහ සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් Central Park Boulevard Port City Colombo අභිමානවත් ලෙස එළිදැක්වීමට නියමිතය.

ඉන්දීය සාගරයේ නවතම ආශ්චර්යය ලෙස සැලකෙන Central Park Boulevard Port City Colombo ව්‍යාපෘතිය නිල වශයෙන් එළිදක්වමින්, ශ්‍රී ලාංකේය දේපළ වෙළෙඳාම් සහ සංවර්ධන ඉතිහාසයේ දැවැන්තම දියත් කිරීමේ උළෙල සනිටුහන් කිරීමට Home Lands සමූහය සූදානම් වේ. "The Grand Launch Weekend" ලෙස නම්කර ඇති මෙම උත්සව මාලාව, 2026 ජුනි 12 සිට 14 දක්වා Cinnamon Life at City of Dreams හි Lumina උත්සව ශාලාවේදී පැවැත්වීමට නියමිතය.

මෙම සුවිශේෂ සති අන්තය 2026 ජුනි 12 වැනි සිකුරාදා දින පැවැත්වෙන "The Night of Emeralds" සමාරම්භක උත්සවයෙන් ආරම්භ වන අතර, එහිදී Central Park Boulevard Port City Colombo ව්‍යාපෘතිය නිල වශයෙන් එළිදැක්වීමට නියමිතය.



> **නමුත් මේ සියල්ලටම වඩා බරපතළ සහ විමල් වීරවංශගේ සමස්ත දේශපාලන අනාගතයම තීරණය කරන ප්‍රධානතම නෛතික තර්ජනය වන්නේ ඔහුට එරෙහිව මහාධිකරණයේ විභාග වන 'අයථා වත්කම් උපයාගැනීමේ' නඩුවයි.**

පණිවුඩයකි. එමෙන්ම විමල්ගේ සොයුරු සරත් වීරවංශට එරෙහිවද රජයේ වාහන අවභාවිත කිරීම සම්බන්ධයෙන් මේ වනවිට අධිකරණය හමුවේ නඩුවක් විභාග වෙමින් තිබේ.

නමුත් මේ සියල්ලටම වඩා බරපතළ සහ විමල් වීරවංශගේ සමස්ත දේශපාලන අනාගතයම තීරණය කරන ප්‍රධානතම නෛතික තර්ජනය වන්නේ ඔහුට එරෙහිව මහාධිකරණයේ විභාග වන 'අයථා වත්කම් උපයාගැනීමේ' නඩුවයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවරා ඇති මෙම නඩුව හරහා චෝදනා එල්ල වන්නේ ඔහු අමාත්‍යවරයකු ලෙස කටයුතු කළ 2009 සහ 2015 අතර කාලය තුළ රුපියල් මිලියන 75කට අධික මුදල් සහ දේපළ නීත්‍යානුකූල නොවන අයුරින් උපයාගත් බවටය. මීට අමතරව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අයත් වාහන 40කට ආසන්න ප්‍රමාණයක් සිය පක්ෂ ක්‍රියාකාරීන්ට සහ ඥාතීන්ට අවභාවිත කිරීමට ඉඩ සැලසීම සම්බන්ධයෙන් පොදු දේපළ පනත යටතේ එල්ල වී ඇති චෝදනා ද ඔහුගේ ගෙල වටා තද වෙමින් පවතින තොණ්ඩුවක් බඳුය. පොදු දේපළ පනත යටතේ එල්ල වන චෝදනාවලින් බේරීම සෙසු සාමාන්‍ය නඩුවලට වඩා අතිශයින්ම

# ු වෙයිද?

දුෂ්කරය. මෙම නඩුවල අවසන් තීන්දු ප්‍රකාශයට පත් කෙරෙන දින වකවානු පිළිබඳ මේ වනවිට නීති ක්ෂේත්‍රයේ මෙන්ම දේශපාලන කරළියේද දැඩි අවධානයක් යොමුව තිබේ. අධිකරණ ක්‍රියාවලියේ ස්වභාවය අනුව වසර ගණනාවක් තිස්සේ ඇදී ආ සාක්ෂි විභාගයන් දැන් පවතින්නේ අවසන් තීරණාත්මක අදියරක බැවින්, ඉදිරි මාස කිහිපය තුළ මෙම නඩුවල අවසන් තීන්දු ප්‍රකාශයට පත්වීමට නියමිතය. නීති විශාරදයන් පවසන අන්දමට, මෙම වත්කම් සහ දූෂණ චෝදනා යටතේ ඔහු වරදකරු වුවහොත් දිගුකාලීන සිරදඬුවම් නියම වීමේ දැඩි අවදානමක් පවතින අතර, එසේ වුවහොත් ඔහුට සිය ප්‍රජා අයිතිය මෙන්ම පාර්ලිමේන්තුවට තරග කිරීමේ අවස්ථාවද අහිමි වීමේ නෛතික ප්‍රතිපාදන ඉබේම සක්‍රීය වනු ඇත.

මේ සියලු සිදුවීම් පෙළගැසෙන ආකාරය දෙස දේශපාලන උපක්‍රමික ඇසකින් බලන කල පෙනී යන්නේ, විමල් වීරවංශ මේ වනවිට මෙරට ප්‍රධාන ධාරාවේ දේශපාලන බලවේගයන්ට අත්‍යාවශ්‍ය නොවන, එහෙත් ඕනෑම මොහොතක අනතුරුදායක විය හැකි 'හුදෙකලා චරිතයක්' බවට පත්ව ඇති බවයි. කලක් මහින්ද රාජපක්ෂ පාලන සමයේ පාලක පක්ෂයේ ප්‍රධානතම තුරුම්පුවක් වූ, ජනතාව වීදි බැස්සවීමේ අසමසම හැකියාවක් තිබූ වීරවංශ, පසුව ඇතිවූ දේශපාලන පෙරළි හරහා ක්‍රමයෙන් පාලක ප්‍රභූ පැළැන්තියෙන් ඈත් විය. අවසානයේ ඔහු නියෝජනය කළ ජාතිකවාදී කඳවුරද විවිධ කැබැලිවලට බිඳී ගියේය. වර්තමාන දේශපාලන සිතියම තුළ ඔහුට ස්ථාවර බලවත් මිත්‍රයන් නැත. ඔහු වටා සිටි දැවැන්ත ජන පදනම සහ ආකර්ෂණීය දේශපාලන සටන් පාඨද මේ වනවිට නිහඬවී ගොස් හමාරය. එබැවින්, ඔහුට එරෙහිව ක්‍රියාත්මක වන නීතිමය ක්‍රියාවලිය පිටුපස දේශපාලන පළිගැනීම් ඇති බවට ඔහුගේ පාර්ශ්වයෙන් කෙතරම් තර්ක කළද, පොදු මහජනතාව තුළ හෝ දේශපාලන කරළිය තුළ ඔහු වෙනුවෙන් පෙනීසිටීමට හෝ පෙර පරිදි වීදි බැස සටන් කිරීමට කිසිවකුත් ඉදිරිපත් නොවන තත්ත්වයක් නිර්මාණය වී තිබේ.

ඉදිරියේදී විමල් වීරවංශට කුමක් සිදුවනු ඇතිද යන ප්‍රශ්නයට ඇති කෙටිම පිළිතුර නම්, ඔහු සිය ජීවිතයේ අඳුරුතම සහ අසීරුතම දේශපාලන නිමේෂයට මුහුණ දෙමින් සිටින බවයි. ඉදිරි අධිකරණ තීන්දු ඔහුට අහිතකර වුවහොත්, දිගුකාලීන සිරදඬුවමකට යටත් වීමට සිදුවීමත් සමග ඔහුගේ සක්‍රීය දේශපාලන ජීවිතයේ අවසානය සනිටුහන් වීමට බොහෝ දුරට ඉඩකඩ තිබේ. එසේ නොමැතිව යම් හෙයකින් ඔහු මෙම නෛතික උගුල්වලින් බේරී ආවද, අහිමි වූ දේශපාලන විශ්වසනීයත්වය සහ බිඳවැටුණු සගයන්ගේ ජාලය නැවත ගොඩනැගීම අසීරු වනු ඇත. ජනප්‍රිය රැල්ලේ දේශපාලන වේදිකාවන් සිසාරා ගිගුරුම් දුන් ඒ වාග් චාතුර්යය සහ ආවේගශීලී දේශපාලන රංගනය, නීතියේ සහ සිරකුටියේ රළු බිත්ති හමුවේ නිහඬ වන දිනය වැඩි ඈතක නොවන බව ඇතැමුන් මතුකරන තර්කයකි. එසේ වුවහොත් විමල් වීරවංශ යනු ලංකේය දේශපාලන නාට්‍යයේ බලය, ප්‍රසිද්ධිය සහ පිරිහීම පිළිබඳ ලියැවුණු තවත් එක් සුවිශේෂ සහ ඛේදනීය පරිච්ඡේදයක් පමණක් වනු ඇත.

*මාකස් ප්‍රනාන්දුපුල්ලේ*

---

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත**

**හදිසි නීතිය - ICCPR පනත**

# මර්දන නීති ක්‍රියාත්මක කළ අයටම අද ඒවායින් බැටකන්න සිදුවෙලා

## අහෝසි කරන්න කියපු අයම අද ඒවා ක්‍රියාත්මක කරනවා




ජනාධිපති නීතිඥ සාලිය පීරිස්

**ශ්‍රී ලංකාවේ බලයට පත් වූ අනුප්‍රාප්තික ආණ්ඩු විසින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA), සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුති පනත (ICCPR) සහ හදිසි නීති රෙගුලාසි වැනි කෲර මෙන්ම මර්දනකාරී නීති අත්තනෝමතික ලෙස අවභාවිත කිරීම තමන් ඇතුළු පිරිසක් දිගින් දිගටම හෙළාදුටු බව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු සභාපති, ජනාධිපති නීතිඥ සාලිය පීරිස් පවසයි.**

රට තුළ වත්මන් ආරක්ෂක සහ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවන පෙරළි කෙරෙහි අවධානය යොමුකරමින් සිය නිල ෆේස්බුක් ගිණුමෙහි විශේෂ සටහනක් තබමින් ඔහු අවධාරණය කරන්නේ, එදා මෙම මර්දනකාරී නීති ආරක්ෂා කරමින් ඒවා ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු වූ ඇතැම් පුද්ගලයන්ටම අද දවසේ එම නීතිවලින්ම බැටකෑමට සිදුව ඇති අපූර්ව දේශපාලන උඩුයටිකුරු වීමක් රට තුළ නිර්මාණය වී ඇති බවයි.

### දේශපාලන සෙල්ලම් සහ ව්‍යවස්ථාපිත අයිතිය

කිසියම් පුද්ගලයෙකු රැඳවුම් භාරයේ තැබිය යුතුද නැද්ද යන්න තීරණය කිරීම ජනාධිපතිවරුන්, අමාත්‍යවරුන්, ලේකම්වරුන් හෝ පොලිස් නිලධාරීන් වැනි විධායකයේ බලධාරීන්ට පැවරිය නොයුතු බවත්, එය මුළුමනින්ම නීතියට අනුව කටයුතු කරන ස්වාධීන විනිසුරුවරුන් වෙත පැවරිය යුතු බවත් සාලිය පීරිස් පෙන්වා දෙයි.

මෙම මර්දනකාරී නීති අහෝසි කරන ලෙස ඉල්ලා සිටි ඇතැම් පාර්ශ්වයන් පවා පසුව බලයට පැමිණ ඒවා ක්‍රියාත්මක කිරීමට සහ ඒවා මත යැපීමට කටයුතු කළ ආකාරයද ඔහු සිහිපත් කරයි.

කෙසේ වුවද, අදාළ පුද්ගලයා කවුරුන් වුවද, ඔහුට එරෙහිව එල්ල වී ඇති චෝදනා කවරක් වුවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය මගින් සහතික කර ඇති මානුෂීය ගෞරවය, නීතියේ රැකවරණය සහ නිදහස ලැබීමට සෑම පුරවැසියෙකුටම අයිතියක් ඇති බව ජනාධිපති නීතිඥවරයා සිහිපත් කරයි. ව්‍යවස්ථාවෙන් පිරිනමන එම ආරක්ෂාව පුද්ගලයාගෙන් පුද්ගලයාට හෝ පවතින දේශපාලන තත්ත්වයන් මත වෙනස් විය නොහැකි බවත්, පොලිස් හෝ බන්ධනාගාර රැඳවුම් භාරයේදී වධහිංසා පැමිණවීම, කෲර, අමානුෂික හෝ අවමන්සහගත සැලකීම්වලට ලක්කිරීම (Torture, cruel, inhuman and degrading treatment) කිසිසේත් අනුමත කළ නොහැකි බවත් ඔහු වැඩිදුරටත් කියා සිටියි.

දේශපාලන කුමන්ත්‍රණ චෝදනා සහ නීතියේ ආධිපත්‍යය අතර දෝලනය වන වත්මන් ශ්‍රී ලාංකීය සමාජයට, නීතිය හැමදෙනාටම සමාන වියයුතු බවත්, මර්දනය කා දෙසට හැරුණත් එය මර්දනයක්ම බවත් පෙන්වා දෙන සාලිය පීරිස්ගේ මෙම ප්‍රකාශය දකුණේ දේශපාලන මෙන්ම නීතිමය ප්‍රජාව තුළ දැවැන්ත සංවාදයකට මග පාදා තිබේ.

*TheLeader.lk*

---




ආචාර්ය මොහිලාල් ද සිල්වා
සභාපති
SLT සමූහ ව්‍යාපාරය

රියාස් රෂීඩ්
ප්‍රධාන විධායක නිලධාරී
SLT-MOBITEL

# SLT-MOBITEL
## පළමු කාර්තුවෙන්ම වාර්තාගත වර්ධනයක්

SLT සමූහය මෙම මූල්‍ය වර්ෂයට ශක්තිමත් ආරම්භයක් ලබාගනිමින්, 2025 පළමු කාර්තුවට සාපේක්ෂව 2026 පළමු කාර්තුවේදී ආදායමේ කැපීපෙනෙන වර්ධනයක් සහ කැපීපෙනෙන ලාභදායීත්වයක් වාර්තා කරගැනීමට සමත් වී තිබේ. මෙහෙයුම් ලාභය සහ ශුද්ධ ඉපැයුම් සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ බ්‍රෝඩ්බෑන්ඩ් (අන්තර්ජාල) සේවාවන් සඳහා අඛණ්ඩ ඉල්ලුමක් පැවතීම මීට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. සමූහයේ මෙම ප්‍රතිඵල තීරණාත්මක හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කරන අතර, එය වසරේ ඉදිරි කාලය සඳහා සැලකිය යුතු උත්තේජනයක් වනු ඇත.

2026 වසරට ශක්තිමත් ආරම්භයක් ලබාගනිමින්, රු. බිලියන 30.8ක සමුච්චිත ආදායමක් වාර්තා කරගැනීමට සමූහය සමත් විය. මෙය 2025 පළමු කාර්තුවේදී වාර්තා වූ රු. බිලියන 27.9ට සාපේක්ෂව 10.6%ක වර්ධනයකි. බ්‍රෝඩ්බෑන්ඩ් සේවාවන් සඳහා පැවති ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් සමූහයේ දළ ලාභය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව 14.1%කින් වර්ධනය වී රු. බිලියන 14.6ක් ලෙස වාර්තා විය.

මෙහෙයුම් ලාභය පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 3.7ට සාපේක්ෂව 39.1%කින් ඉහළ ගොස් රු. බිලියන 5.1ක් ලෙස වාර්තා වී තිබේ. බදු පෙර ලාභය 2025 පළමු කාර්තුවේදී වාර්තා වූ රු. බිලියන 2.7ට සාපේක්ෂව 55.4%කින් ඉහළ ගොස් රු. බිලියන 4.2ක් ලෙස වාර්තා වී ඇත. බදු පසු ලාභය රු. බිලියන 3.1ක් වූ අතර, එය පෙර වසරේ වාර්තා වූ රු. බිලියන 2ට සාපේක්ෂව 53.3%ක වර්ධනයකි.

# HAYLEYS අරන් ආ සුපිරිම HEV PREMIUM HYBRID TL JAECOO J5




හේලීස් ෆෙන්ටන්ස් ලිමිටඩ් (Hayleys Fentons Limited) ආයතනයේ මොබිලිටි අංශය වන හේලීස් මොබිලිටි ලිමිටඩ් (Hayleys Mobility Limited), සිය නවතම JAECOO J5 HEV රථය ශ්‍රී ලාංකික වෙළෙඳපොල වෙත හඳුන්වා දී ඇත.

මේ වනවිට ශ්‍රී ලංකාව තුළ නව බලශක්ති වාහන (NEV) සඳහා වන ඉල්ලුම ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින පසුබිමක, පාරිභෝගිකයන්ගේ කාලීන අවශ්‍යතාව සපුරාලමින් උසස් තාක්ෂණයෙන් යුත් හයිබ්‍රිඩ් SUV වාහන පෙළ පුළුල් කිරීම මෙම නව හඳුන්වාදීමේ ප්‍රධාන අරමුණයි.

නව පරපුරේ නාගරික ජීවන රටාවන් ගතකරන සහ සංචාරය සඳහා වැඩි උනන්දුවක් දක්වන ලාංකිකයන් වෙනුවෙන්ම සැලසුම් කර ඇති JAECOO J5 HEV රථය, දියුණු ස්මාර්ට් හයිබ්‍රිඩ් තාක්ෂණයකින් සමන්විතය. ඉහළම ආරක්ෂාව, උපරිම සුවපහසුව මෙන්ම ඉන්ධන කාර්යක්ෂමතාව සහ ඉහළ ක්‍රියාකාරීත්වය මැනැවින් සමබර කරන මෙම මෝටර් රථය, නාගරික මාර්ග තදබදයකදී මෙන්ම දුරබැහැර ධාවනයේදීද ඉතා සුමට අත්දැකීමක් සහතික කරයි.

# පළමු වරට ලංකාවේ සූර්ය බලයෙන් පාවෙන අවන්හල SUN SIYAM PASIKUDAH



ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ ප්‍රථම සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන මෙම පාවෙන අවන්හලේ සුන්දර අත්දැකීම, නැගෙනහිර වෙරළ තීරයේ වූ නැවුම් රසයන් ද සමගින් මුහුද මත විවෘත පරිසරයට රැගෙන එයි. මාලදිවයින කේන්ද්‍ර කරගත් Sun Siyam Resorts හෝටල් ජාලයේ Privé Collection එකතුවේ කොටසක් වන Sun Siyam Pasikudah Resort පාසිකුඩා ප්‍රදේශයේ මුහුද මත පාවෙන අවන්හල වන Aqua Lounge නිල වශයෙන් දියත් කර ඇත. මෙය මෙම මුහුදු ප්‍රදේශය තුළ ඇති එකම පාවෙන අවන්හල වීම සුවිශේෂත්වයකි. එමෙන්ම මෙය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ ඉන්දියන් සාගරය මත පිහිටි එකම පාවෙන සුඛෝපභෝගී භෝජන අත්දැකීම (fine-dining experience) වේ. දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පවතින වැව් සහ ගංගා ආශ්‍රිත ස්ථානවලින් පැහැදිලිවම වෙනස් වූ මෙම පාවෙන අවන්හල මෙම වෙරළ තීරයේ හැර වෙනත් කිසිදු ස්ථානයක් නොමැත.

වර්ග අඩි 400ක වපසරියකින් යුත් මෙම අවන්හල වෙත සංචාරකයන්ට හෝටල් වෙරළ තීරයේ සිට සෘජුවම පාරුවකින් (catamaran) ළඟාවිය හැකිය.

# ගෝල්ෆේස් හෝටලේ තිබ්බ ZTE DAY 2026

ශ්‍රී ලංකාවේ සන්නිවේදන සහ ඩිජිටල් ක්ෂේත්‍රයේ අනාගතය වෙනුවෙන් නව මාවතක් විවර කරමින් ZTE ලංකා සමාගම විසින් සංවිධාන කළ 'ZTE Day 2026' තාක්ෂණික සමුළුව පසුගියදා ගාලුමුවදොර හෝටල් පරිශ්‍රයේදී ඉතා සාර්ථක ලෙස පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීමට නවතම තාක්ෂණික විසඳුම් රැසක් හඳුන්වා දෙමින් පවත්වන ලද මෙම උත්සවය සඳහා සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන්, ව්‍යාපාරික හවුල්කරුවන්, තාක්ෂණවේදීන් සහ මාධ්‍ය නියෝජිතයන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගි වූහ.

'බුද්ධිමත් අනාගතයක් නිර්මාණය කිරීම' (Creating an Intelligent Future) යන තේමාව යටතේ පැවැත්වුණු මෙම සමුළුවේදී, සන්නිවේදනය, පරිගණක තාක්ෂණය, කාර්යසාධන හැකියාව සහ බුද්ධිමය තාක්ෂණය යන මූලික කරුණු ඔස්සේ නවෝත්පාදනයන් මෙහෙයවීමට ZTE සමාගම සතු කැපවීම මැනැවින් ප්‍රදර්ශනය කෙරිණි. දියුණු තාක්ෂණික විසඳුම් මගින් මිනිස් පරිකල්පනය සහ යථාර්ථය අතර පරතරය අවම කර ශ්‍රී ලංකාවේ ව්‍යාපාර, ප්‍රජාවන් සහ පාරිභෝගිකයන් වෙත නව අවස්ථා උදාකරනු ලබන්නේ කෙසේද, යන්න පිළිබඳ මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා කෙරිණි.




# IPG සමූහය LPL ක්‍රීඩකයන් තෝරා අවසන්




2026 වසර සඳහා වන LPL ක්‍රීඩක තේරීම IPG සමූහය විසින් පසුගියදා සාර්ථකව අවසන් කරන ලදී. LPL හි 6 වැනි අදියරෙහි සුවිශේෂ කඩඉමක් සනිටුහන් කළ එම ක්‍රීඩක තේරීම සමග කණ්ඩායම් සඳහා දෙස් විදෙස් ක්‍රීඩකයන් එක්කර ගැනීමට අවස්ථාව උදාවිය.

මෙහිදී එම කණ්ඩායම් සියල්ලම තරගාවලිය සඳහා තම කණ්ඩායමට සුදුසු ක්‍රීඩකයන් තෝරාගැනීමට කටයුතු කළ අතර, එම අවස්ථාව සඳහා කණ්ඩායම් හිමිකරුවන්, නියෝජිතයන්, ක්‍රිකට් නිලධාරීන් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් එක්ව සිටියේය. ප්‍රසිද්ධ ක්‍රීඩකයන්, නැගීඑන ක්‍රීඩකයන් මෙන්ම දෙස් විදෙස් ක්‍රීඩකයන් සමගින් මෙවර තරගාවලිය ඉතා උද්වේගකර තරගාවලියක් බවට පත්වනු ඇත.

මෙම ක්‍රීඩකයන් තෝරාගැනීමේ අවස්ථාව ඉතා සාර්ථකව අවසන් වීම තුළින් පෙනීයන්නේ LPL තරගාවලිය වෘත්තීය හා විනෝදාස්වාද අංශයන් තුළින් ලබා ඇති දියුණුවයි.

# මාරිස් ස්ටෙලා COLLEGE DAY ORATION සෙනසුරාදා



මීගමුව මාරිස් ස්ටෙලා විද්‍යාලයීය පැරණි ශිෂ්‍ය සංගමය සංවිධාන කරන College Day Celebration with Maris Panorama වැඩසටහන යටතේ පැවැත්වෙන වාර්ෂික College Day Oration උත්සවය ජුනි 6 වැනි සෙනසුරාදා ප.ව. 6.00ට මාරිස් ස්ටෙලා විද්‍යාලයීය පැරණි ශිෂ්‍ය සංගම ගොඩනැගිල්ලේදී පැවැත්වීමට නියමිතය.

මෙවර ප්‍රධාන දේශනය පවත්වනු ලබන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශේෂඥයකු, ගුරු පුහුණුකරු, ලේඛකයකු සහ අධ්‍යාපන උපදේශකයකු වන ආචාර්ය ලක්ෂ්මන් නෝනිස් මහතා විසිනි. විද්‍යා අධ්‍යාපනය, ගුරු පුහුණුව, විෂයමාලා සංවර්ධනය සහ අධ්‍යාපන උපදේශනය යන ක්ෂේත්‍රවල ඔහු සතු දැනුම හා අත්දැකීම් මෙම දේශනයට විශේෂ වටිනාකමක් එක් කරයි.

මෙවර වාර්ෂික දේශනයේ තේමාව වන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ අනාගතයට ගැළපෙන අධ්‍යාපන විෂයමාලාවක් සකස් කිරීමේ අවශ්‍යතාවයි.




# IT GALLERY COMPUTERS
## පරිගණක ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශේෂ සම්මාන දිනයි

මෙරට තොරතුරු තාක්ෂණික මෙවලම් බෙදාහැරීමේ වෙළෙඳපලේ ප්‍රමුඛ පෙළේ සන්නාමයක් වන IT Gallery (Pvt) Ltd පසුගිය දා පැවැති Lenovo 360 Accelerate 2026 ජාත්‍යන්තර සමුළුවේ දී ශ්‍රී ලංකාවේ පරිගණක ක්‍රීඩා (Gaming) සහ දෘශ්‍ය තාක්ෂණික (Visual) ක්ෂේත්‍රයේ වර්ධනය උදෙසා දක්වන ලද සුවිශේෂ දායකත්වය වෙනුවෙන් Distributor Excellence Award 2025-2026 | Gaming & Visual Sri Lanka සම්මානයෙන් පිදුම් ලැබීය. දීර්ඝ කාලයක් පුරා Lenovo සන්නාමය සහ IT Gallery Computers සමාගම අතර පවත්නා සහයෝගිතාවයේ තවත් එක් සුවිශේෂ සන්ධිස්ථානයක් මෙමගින් සනිටුහන් වේ.

පරිගණක ක්‍රීඩා (Gaming), නිර්මාණකරණ උපාංග (Creator devices) සහ දෘශ්‍ය පරිගණක විසඳුම් (Visual computing solutions) වැනි වේගයෙන් වර්ධනය වන තාක්ෂණික ක්ෂේත්‍රයන් තුළ Lenovo සන්නාමයේ දේශීය වෙළෙඳපල තවදුරටත් පුළුල් කිරීම සඳහා IT Gallery Computers (Pvt) Ltd ඉටුකළ සුවිශේෂ මෙහෙය මෙම සම්මානය ඔස්සේ විශේෂ ඇගයීමකට ලක්විය. ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) පද්ධතියේ සවිමත් වෙළෙඳ සබඳතා ගොඩනගමින් වෙළෙඳපල ප්‍රවර්ධනයට සහ පාරිභෝගික විශ්වාසය දිනාගැනීමට සමාගම දැරූ අඛණ්ඩ උත්සාහය මෙම ඇගයීම ඔස්සේ මැනැවින් ඉස්මතු විය.







# එන්න අල්ලස් ගත්ත අය අත්පුඩි ගහලා පිළිගන්න

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අල්ලස් ගැනීම, අල්ලස් දීම හෝ අල්ලස් දීමට උත්සාහ කිරීම, අල්ලස් ගැනීමට උත්සාහ කිරීම කියන මේ හැමදේම වරදේ විදියටයි සාමාන්‍යයෙන් සලකන්නේ. එවැනි අල්ලස් ගැනීමට උත්සාහ කරන ලද රාජ්‍ය නිලධාරියෙකුට හෝ වෙනත් ඕනෑම තරාතිරමක පුද්ගලයෙකුට විරුද්ධව නීතිමය පියවර ගැනීමේ හැකියාව ලංකාවේ තියෙනවා.**

මෙවැනි නීතිරීති සියල්ලම ලංකාවේ ක්‍රියාත්මක වෙමින් තියෙද්දී, පසුගිය දවසක අල්ලස් සම්බන්ධව සිදුවීමක් ගැන අපිට අහන්න ලැබුණා. ලංකාවේ දූෂණ විරෝධී පනත 2023 අංක 09 දරන යාවත්කාලීන පනත ක්‍රියාත්මක වෙනවා. ඇත්තටම අල්ලස් පනත 1954 අංක 11 දරන පනත විදියටයි අපිට හඳුනාගන්න පුළුවන් වෙන්නේ. මේ සියලු අණ පනත් හරහා ලංකාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණ පවත්වනවා, වැටලීම් සිද්ධ කරනවා.

ලිංගික අල්ලස්, පුද්ගලික අංශයේ දූෂණ, වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම, දේපළ රාජසන්තක කිරීම මෙවැනි නීතිමය පියවරවල් අරගන්න සහ මෙවැනි ප්‍රශ්න මේවත් එක්ක බැඳිලා තියෙනවා. රාජ්‍ය සේවකයෙකු, අධිකරණ නිලධාරියෙකු, මන්ත්‍රීවරයෙකු තමන්ගේ නිල තත්ත්වය අයථා ලෙස භාවිත කර මුදල් හෝ වෙනත් වරප්‍රසාද ලබාගැනීම අල්ලස් ගැනීමක් විදියට සලකනවා 1954 අංක 11 දරන අල්ලස් පනත යටතේ. ඉතින් මේවා ගැන මම හිතන්නේ ලංකාවේ ජීවත්වෙන බොහෝ දෙනෙක් දන්නවා.

නමුත් ප්‍රශ්නය තියෙන්නේ අල්ලස් දීම හෝ අල්ලස් ගැනීම සම්බන්ධයෙන් සාමාන්‍ය රාජ්‍ය සේවකයෙකුට හෝ සාමාන්‍ය පුද්ගලයෙකුට ක්‍රියාත්මක වෙන නීතියම ඇතැම් අයට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අපි දන්නවා අල්ලස් චෝදනාවක් මත සැකපිට අත්අඩංගුවට ගත්තු, රක්ෂිත බන්ධනාගාර ගතකර සිට, පසුව ඇප මත නිදහස් කරපු, මාලිමාවට බලය හිමි කුරුණෑගල නියෝජ්‍ය නගරාධිපති අසරුදීන් මොහිනුන් මහතා සම්බන්ධ කතාව. එම කටයුත්තේදී ඔහුට විරුද්ධව පරීක්ෂණයක් මේ වෙනකොට පැවැත්වෙනවා. ඔහුව අත්අඩංගුවට අරගෙන නිදහස් කරලා ගෙදර යවන්නේ ඇප මත. ඒ කියන්නේ ඇප පිට ගෙදර යැව්වා කියන්නේ ඔහු නිදොස් කර නිදහස් වුණා කියන එක නෙවෙයි.

දැන් ප්‍රශ්නය තියෙන්නේ ඔහුව පිළිඅරගෙන ඔහුට උත්සව පවත්වලා, ඔහු පිළිගැනීමේ කතන්දර කරලා, අත්පුඩි ගහලා ඔහුව ආයෙත් ගෙනල්ලා නියෝජ්‍ය නගරාධිපති පුටුවේ වාඩි කරවනවා. එහෙම කරන්න පුළුවන්ද? ප්‍රශ්නය තවමත් විසඳිලා නැහැ. ඔහු අල්ලස් චෝදනාවක් මත සැකපිට අත්අඩංගුවට ගත්තු පුද්ගලයෙක්. ඔහුගේ අල්ලස් චෝදනාව සම්බන්ධයෙන් ඉතාම ඉහළ මට්ටමේ පරීක්ෂණ තාමත් පැවැත්වෙනවා. මෙවැනි පරීක්ෂණයක් තාම අවසන් වෙලා නැහැ. අඩුම තරමේ පරීක්ෂණය අවසන් වනතුරු, ඔහු සම්බන්ධයෙන් නීතිමය තීරණයක් ලැබෙනතුරු, නැත්නම් ඔහු නිදොස් කියලා දැනුම් දෙනතුරුවත් අඩුම තරමේ ඉවසන්න බැරි මොකක්ද මේ ප්‍රශ්නය? ඊළඟ කාරණාව තමයි නීතිය සැමට සාධාරණයි කියලා තමයි මේ අය ආවේ. එතකොට ඒක බොරුවක්ද? ඇත්තටම අපි දකිනවා බොහෝ තැන්වලදී මෙවැනි ක්‍රියාකාරකම් මේ ආණ්ඩුව සිද්ධ කරනවා. දැන් ඒකෙදි මෙන්න මෙහෙම තර්කයක් තියෙනවා. මොකද හේතුව රටේ මෙවැනි සිදුවීම් මීට කලින් වෙලා නැහැ නෙවෙයි. දැන් ඔහුගේ චෝදනාව බැලුවොත්, කුරුණෑගල ප්‍රධාන බස් නැවතුම්පොළ පිරිසිදු කිරීම සහ ඒ පොදු වැසිකිළි පද්ධතිය නඩත්තු කිරීමේ ටෙන්ඩරය ව්‍යාපාරිකයෙකුට ප්‍රදානය කිරීම සඳහා මෙම අල්ලස් මුදල ඉල්ලලා තියෙනවා කියලා තමයි කියන්නේ. අදාළ ටෙන්ඩරය ලබාදීම වෙනුවෙන් මූලික ගෙවීමක් ලෙස රුපියල් ලක්ෂ 30ක් සහ ඊට අමතරව මාසිකව රුපියල් ලක්ෂ 5 බැගින් අල්ලස් මුදලක් ඔහු විසින් ඉල්ලා ඇති බව විමර්ශන වලදී හෙළිවෙලා තියෙනවා කියලා ඇතැම් තැන්වල සඳහන් වෙලා තියෙනවා.

මේ සම්බන්ධයෙන් ඔහුව අත්අඩංගුවට ගන්නවා. ඔහු අත්අඩංගුවට ගන්නේ ව්‍යාපාරිකයෙක් කළ පැමිණිල්ලකට අනුව. බත්තරමුල්ල ප්‍රදේශයේදී අදාළ ලක්ෂ 30ක මුදල ලබාගැනීමට පැමිණි අවස්ථාවේදී අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව විසින් ඔහුව අත්අඩංගුවට ගත්ත බව තමයි අපිට දැනගන්න ලැබුණේ. ඔහුව අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පස්සේ රක්ෂිත බන්ධනාගාර ගතකළා. නමුත් පසුව ඔහුට ඇප ලැබුණා. දැන් මේ පුද්ගලයා ගැන කතා කළොත් ඔහු ඇත්තටම මාලිමාව නියෝජනය කරන කෙනෙක් නෙමෙයි.

ඔහු රිෂාඩ් බදියුදීන් මහතාගේ සමස්ත ලංකා මහජන කොංග්‍රසය නියෝජනය කරමින් සභාවට තේරී පත්වුණු බව තමයි අපිට දැනගන්න ලැබෙන්නේ.

මෙම චෝදනාව සම්බන්ධයෙන් ඔහුගේ පක්ෂ සාමාජිකත්වය වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීමට පක්ෂය විසින් තීරණයක් ගත්තා කියලා පසුගිය දිනවල ප්‍රවෘත්ති වාර්තා වෙලා තිබුණා. නමුත් දැන් ප්‍රශ්නය තියෙන්නේ ඔහුට රිෂාඩ් බදියුදීන්ලා එහෙම නැත්නම් මහජන කොංග්‍රසය විසින් ගන්න ඕනෙ තීන්දු තීරණ අරගෙන තියෙනවා. නමුත් නගරාධිපතිතුමාගේ පාලනය යටතේ ඔහුට නිසි පියවර ගත්තද කියන එකයි ප්‍රශ්නය.

මේකේ වැදගත්ම දේ තමයි මේ එක එක්කෙනාට එක එක හැන්දෙන් බෙදන්න නීතිය ක්‍රියාත්මක කරනවා නම් ඒක හරියන වැඩක් නෙවෙයි. සාමාන්‍ය මනුස්සයෙක් අල්ලස් හෝ දූෂණ වරදක් කළාම, ඔහුට ආයෙත් තනතුර දීලා, තාන්න මාන්න දීලා, අත්පුඩි ගහලා, විසිල් ගහලා, බල්ටි ගහලා, පෙරහැරවල් තියලා පිළිගන්නේ නැහැ. මොකද වරදක් ඔප්පු වනතුරු මනුස්සයෙක් සැකකරුවෙක් විතරයි, ඒක ඇත්ත. හැබැයි සැකකරුවෙක් යළි රාජ්‍ය නිලධාරියෙක් වෙනවා නම් ඔහුගේ සැකය පහ කරගන්න ඕනෙ. ඔහු සැකය දුරු කරලා අධිකරණය මගින් නිදොස් කර නිදහස් කළා නම් කිසි ප්‍රශ්නයක් නැහැ මීට වඩා ලොකු පෙරහැරක් කරලා අලි ඇත්තු පිට අරගෙන ආවත්. හැබැයි දැන් වෙලා තියෙන්නේ මේ ඇප දීලා ගෙදර ඇවිල්ලා තියෙන්නේ. ඇප දීලා ගෙදර එනවා කියලා කියන්නේ ඔහු නිදොස් කළා නෙවෙයි. ඔහුව රක්ෂිත බන්ධනාගාර ගතකරන්නේ නැතුව ඔහුට ඇප දීලා ගෙදර යවනවා.

ඒකට හේතුව ලංකාවේ අධිකරණ පද්ධතිය ඇතුළේ අපි දන්නවා මේ වෙනකොට නිතරම යම් වැරදිවලට ඇප ලබාදීම සිද්ධ කරනවා. ඒකට හේතුව තමයි බන්ධනාගාරවල ඉඩකඩ ප්‍රශ්නය තියෙනවා, රඳවා ගැනීම් සම්බන්ධ ප්‍රශ්න ඇතිවෙලා තියෙනවා. බන්ධනාගාර පද්ධතියේ දැඩි තදබදයක් නිර්මාණය වෙලා තියෙනවා. මේවත් එක්ක බොහෝ වෙලාවට පුද්ගලයන්ව යළි යළි අධිකරණයට කැඳවාගත හැකි නම්, ඔහු පැනලා යයි කියලා අවදානමක් නැත්නම්, ඔහුට රට යෑම තහනම් කරලා නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඔහු අධිකරණයට ඉදිරිපත් වේවි යැයි විශ්වාස කරන්න පුළුවන් නම් ඔහුට ඇප මත ගෙදර යන්න අවස්ථාව ලැබෙනවා.

හැබැයි ඉතින් ඒ ගෙදර යන්නේ සමහර විට අනාගතයේ දවසක හිරගෙදර යන්න පාර කපාගෙන ඉන්න ගමනක්. ඒ නිසා මතක තියාගන්න මෙවැනි දේවල් මේ අත්පුඩි ගහන්න, විසිල් ගහන්න, බල්ටි ගහන්න, ඔල්වරසන් දෙන්න දේවල් නම් නෙමෙයි.



ජීවන පහන් තිළිණ

# මෝදිගෙන් පසු භාරතය බෞද්ධ අභිජිත් භාරගනීද?

## ව්‍යවස්ථා නිර්මාතෘ අම්බෙඩ්කාර් දර්ශනය යළි එළියට

**මීට දශක කිහිපයකට පෙරදී පාසල්වල උසස් පෙළ සත්ව විද්‍යා විෂයට (Zoology) අදාළව ගෙම්බන්, කැරපොත්තන් වැනි සතුන් විච්ඡේදනය කිරීම (කැපීමට) සිසුන්ට නියමිතව තිබිණි. මෙහිදී කැරපොත්තාගේ ශරීරය කපා බැලීම ඉතා අප්‍රියජනක කාරියක් විය. එසේ වූයේ අප කවුරුත් හඳුනන කැරපොත්තා යනු අප විසින් පිළිකුලෙන් බලන සත්වයකු හෙයිනි. කැරපොත්තා ගැන එවැනි මතයක් තිබුණද කැරපොත්තා තරම් පිරිසිදු පළිබෝධ සත්වයකු තවත් නැති බව සත්ව විද්‍යාව කියා සිටියි. කැරපොත්තා නොහොත් ඉංග්‍රීසි බසින් හඳුන්වන 'කොක්රෝච්' (Cockroach) නමැති සත්වයා විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන්නේ 'බ්ලැට්ටෝඩියා' (Blattodea) යනුවෙනි. ලෝකයේ විවිධ කැරපොත්තන් විශේෂ 4000ක් පමණ සිටියද මිනිස් වාසයෙහි ජීවත් වන්නේ වර්ග 30ක් පමණක් බව පැවසෙයි.**

මෙලෙස විවිධ කතාබහට ලක්වන කැරපොත්තා ගැන ලියා තබමින් මෙම ලිපිය ආරම්භ කිරීමට හේතු වූයේ ඇයි? සැබැවින්ම මෙය එක්තරා සුවිශේෂ අපූරු කතාන්දරයකි. අපට මෙම කතාව මෙයට දින කිහිපයකට පෙර අසන්නට ලැබුණේ අපගේ යාබද ඉන්දියාවෙනි. එනම් මෙම දිනවලදී මුළුමහත් ඉන්දියාවම විශාල ආන්දෝලනයකට ලක්කර ඇත්තේ මෙම කැරපොතු කතාව හෙයිනි. මෙම අපූරු වතගොතින් කියැවෙන්නේ කැරපොත්තාගේ නාමය භාවිත කරමින් නවතම දේශපාලන පක්ෂයක් ඉන්දියාව තුළ පිහිටුවා ගැනීමටය. මෙය හඳුන්වා දී ඇත්තේ 'කොක්රෝච් ජන්තා පාටි' (Cockroach Janta Party) යනුවෙන් වන අතර, මෙහි සිංහල අරුත වන්නේ 'කැරපොත්තා ජනතා පක්ෂය' යන්න වෙයි. ලෝකයේ විවිධ රටවල සමහර සත්වයන්ගේ නාමයන් භාවිත කරමින් දේශපාලන පක්ෂ තිබුණද මේ ආකාරයේ කැරපොත්තාගේ නාමය භාවිත කරමින් පක්ෂයක් බිහිවීම වාර්තාවක් ලෙස සැලකිය හැකිය. මෙය ආරම්භ කරනු ලැබුවේ පසුගිය 2026 මැයි 16 වැනිදාය. මෙය විටෙක හඳුන්වා දී ඇත්තේ ඉන්දියානු උපහාසාත්මක දේශපාලන ව්‍යාපාරයක් වශයෙනි. මෙලෙසෙ මෙවැනි දේශපාලන පක්ෂයක් ඇරඹීමට නිමිත්තක් වූයේ එරට තුළ සිදුවූ එක්තරා සිදුවීමකි. මෙම තත්ත්වය නිසා විශාල අර්බුදයක් හටගත් අතර, මෙය ප්‍රධාන වශයෙන්ම බලපා තිබුණේ ඉන්දියාවේ තරුණ පරපුර වෙතය.

ඉන්දියානු තරුණ පරපුර මෙසේ මහත් කලබැගෑනියකට සහ කෝපයකට පත්වූ සිදුවීම කුමක්ද? පසුගිය මැයි 15 වැනිදා ඉන්දියාවේ අගවිනිසුරුවරයා වන සූර්ය කාන්ත් (Surya Kant - Chief Justice of India) විසින් මතභේදාත්මක ප්‍රකාශයක් සිදුකළේය. එක්තරා සමාජ රැස්වීමකදී ඔහු ප්‍රකාශ කර තිබුණේ ඉන්දියාවේ වත්මන් සමාජ ක්‍රියාකාරීන් සහ රැකියා විරහිත තරුණයන් කැරපොත්තන් සහ සමාජයේ පරපෝෂිතයන් ලෙස හඳුන්වා දිය හැකි බවයි.

අගවිනිසුරුවරයාගේ මෙම ප්‍රකාශය පැය ගණනක් ඇතුළතදී ඉන්දියාවේ තරුණ පරපුර අතර දැඩි කෝපයක් සහ වෛරයක් ඇති කළේය. එහෙයින් මෙයට නායකත්වය දුන් තරුණ පරපුර විසින් හරියටම දිනකට පසුව ඉහත 'කැරපොත්තා ජනතා පක්ෂය' ආරම්භ කිරීමට පියවර ගත්තේය. මේ සඳහා මුල්වී කටයුතු කිරීමට එක් ඉන්දියානු තරුණකු පෙරමුණ ගත් අතර, ඉන් පසුව තවත් තරුණ නායකන් කිහිප දෙනකු ඔහුගේ මග යමින් ව්‍යාපාරය ශක්තිමත් කිරීමට කටයුතු කළේය.

එම තරුණ නායකයා කවරෙක්දැයි පසුව සොයා බලමු. මෙම තරුණ ව්‍යාපාරය අන්තර්ජාලයේ සමාජ මාධ්‍ය හරහා අතිශයින්ම ප්‍රකට වන්නට විය. එනම් ඉන්ස්ටග්‍රෑම් අඩවිය හරහා තරුණ තරුණියන් 3,50,000ක් එක් දිනක් තුළ ලියාපදිංචි වූ අත අතර, ඔවුන්ට මිලියන 20කට අධික අනුගාමිකයන්ද එක්විය.

දැන් අප මෙම කතාවේ යම් සන්ධිස්ථානයකට පැමිණ සිටින්නෙමු. කැරපොත්තා ජනතා පක්ෂය බිහිකිරීමට පෙරමුණ ගත් තරුණ ඉන්දීය නායකයා කවරෙක්ද? දැනට 30 වැනි වියේ පසුවන මොහුගේ නාමය වන්නේ අභිජීත් දීප්කේ (Abhijeet Dipke)ය. මොහු මුලින් ජනමාධ්‍යවේදය හදාරා මාධ්‍යවේදියකු ලෙස කටයුතු කර ඇති අතර, ඔහු දැනට මහජන සම්බන්ධතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, ඇමෙරිකාවේ බොස්ටන් විශ්වවිද්‍යාලයේ හදාරමින් සිටියි. බොස්ටන් විශ්වවිද්‍යාලය යනු වසර 187ක ඉතිහාසයක් ඇති ලෝකයේ තිබෙන කීර්තිමත් විශ්වවිද්‍යාලයක් වෙයි. 2025 වසරේදී මෙම විශ්වවිද්‍යාලයේ සිසුන් 38,000ක් ඉගෙනුම ලබමින් සිටින බව වාර්තා පෙන්වා දෙයි.

අභිජිත් දිප්කේ නමැති තරුණයා මීට පෙරද ඉන්දියාවේ ප්‍රකට දේශපාලන පක්ෂයක් වන 'ආම් අද්මි පක්ෂයේ' කටයුතුවලට සම්බන්ධ වී ඇත. මේ නිසා ඔහු ඉන්දියානු දේශපාලන සන්නිවේදකයකු සහ ක්‍රියාකාරිකයකු ලෙස ප්‍රකටය. අද ඔහු ඉන්දියාවේ තරුණ පරපුර සහ අනෙකුත් ජනතා පාර්ශ්ව අතර අතිමහත් ජනප්‍රියත්වයකට පත්ව ඇත්තේ මෙම කැරපොතු පක්ෂ දේශපාලනය හරහාය.

සමාජ මාධ්‍ය වේදිකාවලට අමතරව ඔහු පසුගියදා ඇමෙරිකාවේ සිට ඉන්දියාවට පැමිණ නවදිල්ලි නගරයේදී සාමකාමී විරෝධතාවක්ද සංවිධාන කළේය. ඒ සඳහා ලක්ෂ ගණනක පිරිසක් සහභාගි වී ඇති බව ප්‍රකාශ වෙයි.


දැන් ඔබ මෙම කතාවේ යම් හැරවුම් ලක්ෂ්‍යයකටද පැමිණ සිටින්නේය. කිසිදු කාලයක දේශපාලන ඉතිහාසයේ අසන්නට නොලැබුණු මෙම උපහාසාත්මක කැරපොතු දේශපාලනය ලොව බොහෝ පාර්ශ්වවල දැඩි අවධානය යොමුකර ඇත. එනම් ඉන්දියානු වත්මන් දේශපාලන පාර්ශ්වවල කතාබහට ලක්ව ඇත්තේ නුදුරු අනාගතයේදී මෙම තරුණ පාර්ශ්වද දේශපාලනයට පිවිස මහත් ආන්දෝලනයක් ඇතිකරන බවය. මෙහිදී හෙළිවන තවත් සුවිශේෂ කතාවක්ද ඇත. එනම් කැරපොත්තා ජනතා පක්ෂයේ නිර්මාතෘ සහ නායක අභිජීත් දීප්කේ විසින් ප්‍රකාශ කර ඇති සමාජ දර්ශනයයි. ඔහු පසුගියදා නවදිල්ලියේදී පැවැති ශිෂ්‍ය විරෝධතාවයේදී එක්තරා ඉන්දීය ජනතා නායකයකුගේ දර්ශනය සමාජගත කර ඇත.

එනම් ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘ මෙන්ම උදාර ථෙරවාදී බෞද්ධ නායකයකු වූ ආචාර්ය බී.ආර්. අම්බෙඩ්කාර්ගේ සමාජ දර්ශනය අභිජීත් දීප්කේ විසින් මහත් අගැයීමකට ලක්කර ඇත. එනම් ඔහු විසින් ආචාර්ය අම්බෙඩ්කාර්ගේ ස්වයං චර්තාපදාන ග්‍රන්ථය අතැතිව වේදිකාවට පැමිණ තම මත ප්‍රකාශයන් සිදුකළේය. මෙහිදී ඉන්දියාවේ වත්මන් දේශපාලන නායකයන් වෙත ගැඹුරු දේශපාලනික පණිවුඩයක් ගෙන ආවේය. එනම් වත්මන් පාලකයන් තරුණ පරපුරෙහි අධ්‍යාපන අයිතිය සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරන බවට මත ප්‍රකාශ විය. ඉන්දියාවේ පීඩිත ජනතාව වෙනුවෙන් සමාජ සමානාත්මතාව සහ යුක්තිය උදෙසා මහා සටනක් දියත් කළ නායකයා වන්නේ ඉහත පැවැසූ ආචාර්ය අම්බෙඩ්කාර්ය. මෙම සුවිශේෂ කතාව තවත් විග්‍රහ කරන්නේ මෙසේය.

පසුගිය කාලයේ ඉන්දියාවේ මිලියන සංඛ්‍යාත සිසුන්ගේ අනාගතය අඳුරු කළ NEET (නීට්) නමැති විභාග වංචාව හමුවේ තමන් පාලකයන්ගේ මර්දනයට බියගැන්වීම්වලට යටත් නොවන බැව් අභිජීත් දීප්කේ පසුගියදා ප්‍රකාශ කර ඇත. එසේම තම සටන මෙහෙයවන්නේ ආචාර්ය අම්බෙඩ්කාර් ශ්‍රීමතාණන් විසින් නිර්මාණය කරන ලද ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ උත්තරීතර රාමුව තුළ සිටිමින් බවත් ඔහු අවධාරණය කර ඇත.

එමෙන්ම ආචාර්ය අම්බෙඩ්කාර් යනු කුල පීඩනයට සහ සමාජ අසාධාරණයට එරෙහිව තම ජීවිතයේ අවසාන භාගයේදී ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සමග ථෙරවාදී බෞද්ධ දර්ශනය වැළඳගත්, අවිහිංසාව සහ සත්‍යය වෙනුවෙන් පෙනීසිටි ශ්‍රේෂ්ඨ නායකයෙකි.

එසේ නම් මෙම සටන මෙහෙයවන වත්මන් ඉන්දීය තරුණ නායකයා බෞද්ධයෙක්ද යැයි විවිධ මතිමතාන්තර ප්‍රකාශ වී ඇත. එහිදී ප්‍රකාශ වී ඇත්තේ අභිජීත් දීප්කේ යනු ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ප්‍රසිද්ධ 'දාලිත්' පවුලක උපත ලැබුවෙක් බවයි. 'දාලිත් ප්‍රජාව' යනු ආචාර්ය අම්බෙඩ්කාර්ගේ මගපෙන්වීම යටතේ හින්දු කුල පීඩනයට එරෙහිව එකල සමූහ වශයෙන් ථෙරවාදී බුදුදහම වැළඳගත් සමාජ ප්‍රජාවයි. ඒ අනුව අභිජීත් දීප්කේ බෞද්ධයෙක් යැයි සිතිය හැකිය. කෙසේ හෝ මෙම නවතම තරුණයා වත්මන් මෝදි රජයේ පාලනයට සහ හින්දු කුලවාදයට යම් තර්ජනයක් එල්ල කරනු ඇතිය. අභිජීත් දීප්කේ යනු අනාගත ඉන්දීය නායකයෙක්ද?





ප්‍රියන්ත හෙට්ටිගේ



කොයි මොහොතකදී හෝ තමාව අත්අඩංගුවට ගනු ඇතැයි සැකයක් වරුණ ජයසුන්දරට පැනනැගී ඇති බැවිනි.

පාස්කු ප්‍රහාරයේ කුමන්ත්‍රණකරුවන් මෙන්ම මහමොළකරු සොයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එසේ විමර්ශන පවත්වන අතරතුර වත්මන් ආණ්ඩුව පොලිසියට ලබාදුන් තවත් ඉලක්කයක් වූයේ බොරැල්ල පොදු සුසාන භූමියේදී අබිරහස් ලෙස මරණයට පත් වූ ජනශක්ති රක්ෂණ සමාගමේ ප්‍රධානියෙක් වූ දිනේෂ් ශාෆ්ටර්ගේ මරණය ගැන වූ විමර්ශනයයි.

ඒ පෙර ආණ්ඩු සමයේදී කුමන හෝ හේතුවක් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම මරණය සියදිවි හානිකර ගැනීමක් බවට පත්කිරීමට කළ උත්සාහයත් අධිකරණය විසින් එය එසේ නොවන බවටත් එය අපරාධයක් බවටත් නිගමනයකර තිබීම හේතුවෙනි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එදා ඔහුගේ මරණය සියදිවි හානිකර ගැනීමක් බව කියන විට දිනේෂ් ශාෆ්ටර්ගේ පවුලේ උදවිය ඊට එරෙහිව සටන් කළේය. එසේ නොවන්නට එම මරණය සියදිවි හානිකර ගැනීමක් සේ සලකා සියල්ල එතැනින් හමාර කරනු ඇත. දැන් එම මරණය පත්ව ඇත්තේ නොවිසඳුණු මරණයක් බවටය. එම මරණයේ අබිරහස විසඳන්නට ආණ්ඩුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වත්මන් විමර්ශකයන්ට ඉලක්කයක් ලබාදී ඇතත් තවමත් ඒ ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිසි අවධානයක් යොමුවී ඇති බවක් නම් දැනගන්නට නම් නැත. ඒ නිසාම දිනේෂ් ශාෆ්ටර්ගේ මරණය කාලයේ වැලිතලාව අතරේ වැළලී යන්නට ඇති ඉඩකඩ බොහෝය.

ලලිත් කුමාර් සහ කුගන් මුරුගානන්දන් අතුරුදන්වීම සම්බන්ධයෙන් වූ විමර්ශනද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ආණ්ඩුව ලබාදුන් සුවිශේෂ විමර්ශන 07 අතර ඇති විමර්ශනයකි. 2011 වසරේ දෙසැම්බර් 09 වැනිදා යාපනයේදී අතුරුදන් කෙරෙන ඔවුන් මානව හිමිකම් ක්‍රියාකාරිකයන් දෙදෙනෙකි. ඔවුන්ගේ අතුරුදන්වීම දේශපාලනය හා බැඳුණු ආරක්ෂක අංශයේ ක්‍රියාකාරීත්වයක ප්‍රතිඵලයක් බව එකල කියැවිණි. එහි සැකයන් විවිධ පාර්ශ්වයන්ට එල්ලවී ඇතත් ඒ ගැන නිසි විමර්ශනයක් පසුගිය කාලය පුරා සිදු නොවීය.

යහපාලන ආණ්ඩුව පැවැති සමයේදී ඒ ගැන සොයන්නට විවිධ පාර්ශ්ව සහ පොලිසිය උනන්දුවක් දැක්වුවත් ගෝඨාභය රාජපක්ෂ ජනපති වීමත් සමග ඒ හැම දේකටම තැබෙන්නේ නැවතීමේ තිතය. එම අතුරුදන් වීම සිදුවන විට රටේ ආරක්ෂක ලේකම්වරයාව සිටියේ ගෝඨාභය රාජපක්ෂය. ඒ නිසාම ඔහුගෙන් ප්‍රකාශ ගැනීමට මෙන්ම සාක්ෂි ගැනීමට අධිකරණයට කැඳවීමට ගත් උත්සාහයන් රැසක්ම පසුගිය කාලය පුරාවටම දේශපාලන බලය හමුවේ අසාර්ථක වී තිබිණි. එහෙත් දැන් එසේ නැත. අධිකරණය හමුවේ ගෝඨාභය රාජපක්ෂට සාක්ෂි ලබාදීමටත් සිදුව හමාරය. යාපනය අධිකරණයට ගොස් සාක්ෂි ලබාදීම සම්බන්ධයෙන් ඔහුට ඇති ආරක්ෂක හේතුවක් මත වීඩියෝ තාක්ෂණයෙන් ඔහුට එම අවස්ථාව ලැබී ඇත. ඒ යැයි කියා තවමත් ලලිත් කුගන්ට වූ දෙයක් සොයාගෙන නැත. ඒ සම්බන්ධයෙන් වූ විමර්ශනවල නිමාවක් කවදා දකින්නට ලැබේදැයි කියාද පැහැදිලි නැත.

යහපාලන ආණ්ඩුව සමයේදී සිදුවූ දැවැන්තම මූල්‍ය වංචාව ලෙස සැලකෙන මහබැංකු බැඳුම්කර වංචාව ගැන විමර්ශනද කඩිනම් කරන ලෙස බලයට පත්වූ සැණින් ආණ්ඩුව විසින් පොලිසියට ලබාදුන් ඉලක්කයකි. එම විමර්ශනයේ සාර්ථකත්වය බැඳී ඇත්තේ එවක සිටි මහබැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් සමගිනි. ඔහු නොමැතිව ඉදිරි විමර්ශනයක් නැති තරම්ය. සිංගප්පූරුවේ සිටින බව කියන ඔහුව මෙරටට ගෙන්වා ගැනීමට කළ හැකි බොහෝ දේවල් කළත් ඒ සියල්ලක්ම මේ වනවිට පත්ව ඇත්තේ ගඟට කැපූ ඉනි බවටය. අඩුම තරමින් අසාද් මවුලානාගෙන් ප්‍රකාශයක් ගත් ආකාරයටවත් අර්ජුන මහේන්ද්‍රන්ගෙන් ප්‍රකාශයක් ගැනීමට හැකියාවක් ලැබී නැත.

ජාත්‍යන්තර ප්‍රසිද්ධියක් ලද මාධ්‍යවේදියෙක් වන ඩී.පී. සිවරාම් නොහොත් තාරකී ඝාතනය වන්නේ 2005 වසරේදීය. පැහැර ගැනීමට ලක්වූ තාරකී මරා සිරුර දමාගෙ ාස් තිබුණේ පාර්ලිමේන්තු සංකීර්ණය පේන නොපෙනෙන දියවන්නා ඔය අයිනේය. එදා මෙම ඝාතනය ගැන විමර්ශන පවත්වනු ලැබුවේ කොළඹ අපරාධ කොට්ඨාසය විසිනි. එහි ප්‍රධානියා ලෙස සේවයේ නිරතව සිටියේ සරත් ලූගොඩය. එම ඝාතනයේ අලගිය මුලගිය තැන් සියල්ලක්ම කොළඹ අපරාධ කොට්ඨාසය විසින් හෙළිකරගත්තද ඉදිරි විමර්ශනවලට එල්ලවී තිබුණේ දැඩි බාධාය. ඒ නිසාම විමර්ශනවල අවසානයක් දක්නට නොවීය. එකල පැවති රාජපක්ෂ ආණ්ඩුවට හිතවත් උතුරේ ක්‍රියාත්මක වූ සන්නද්ධ දේශපාලන කණ්ඩායමක් මෙම අපරාධය සිදුකළ බව එකල අනාවරණය වී තිබුණි. මහරගම පිහිටි එම කණ්ඩායමේ නිවසක් ගැනද තොරතුරු හෙළිවිය. මෙම අපරාධය ගැනත් සොයන ලෙස ආණ්ඩුව විසින් පොලිසියට භාරකර ඇතත් එම විමර්ශනයද තවමත් ඇත්තේ පෙර පැවති තැනේමය.

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස සේවයේ නිරතව සිටියදී 2006 වසරේදී පැහැරගැනීමට ලක්ව අතුරුදන්වූ මහාචාර්ය සිවසුබ්‍රමනියම් රවින්ද්‍රනාත් සම්බන්ධයෙන්ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මේ වනවිට පුළුල් විමර්ශනයක් සිදුකරමින් ඇත. ඒ ආණ්ඩුව විසින් පොලිසියට භාරදුන් විශේෂ විමර්ශන අතර එම අතුරුදන්වීමද ඇති බැවිනි.

2006 වසරේ දෙසැම්බර් 15 වැනිදා මහචාර්යවරයාව පැහැරගෙන ඇත්තේ පිල්ලෙයාන්ගේ කණ්ඩායම බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් හෙළිකරගෙන හමාරය. ඒ එම පැහැරගැනීමෙන් වසර 19කට පසුවය. එතෙක් කාලයක් එම විමර්ශනය තිබුණේ පැමිණිල්ලකට පමණක් සීමාවෙමිනි. 2025 වසරේ අප්‍රේල් 08 වැනිදා පිල්ලෙයාන් අත්අඩංගුවට ගන්නේ ඒ සම්බන්ධයෙනි. පාස්කු ඉරුදින ප්‍රහාර මාලාවට ඔහුගේ ඇති සම්බන්ධය ගැන කියැවෙන්නේ අනතුරුවය. මහාචාර්යවරයාව පැහැරගෙන ගොස් රඳවා තබාගෙන ඇත්තේ වැලිකන්දේ පිහිටි කඳවුරකය. එය පිල්ලෙයාන් විසින් පවත්වාගෙන ගිය වධ කඳවුරකි. පිල්ලෙයාන්ගේ කණ්ඩායම කප්පම් නොගෙවූ ව්‍යාපාරිකයන් පැහැරගෙනැවිත් දෙතිස් මහා වධ බන්ධනයට ලක්ව ඇත්තේ එම කඳවුරේදීය. මහාචාර්යවරයාද එහි වධ විඳ අවසානයේදී මරාදමා ඇළකට සිරුර විසිකර ඇතැයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැන් හෙළිකරගෙන හමාරය. ඒ පිල්ලෙයාන්ගේ කල්ලියේ සිටි දහ පහළොස් දෙනෙක්ද කොටුකර ගනිමිනි. ඒ අතර පිල්ලෙයාන්ගේ හැම රහසක් ගැනම දන්නා රියැදුරාද සිටීම විශේෂිතය. මේ සම්බන්ධයෙන් වූ විමර්ශන අවසන් කිරීමට දැන් ඇත්තේ මහාචාර්යවරයාගේ සිරුර සොයාගැනීමට පමණි. සිරුර දැමූ තැනද සොයාගෙන ඇතත් තවමත් එතැනින් ඇට කැබැල්ලක්වත් සොයාගන්නට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හැකිවී නැත. මේ තත්ත්වය මත නඩුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පැනනැගී ඇත්තේ ගැටලුවකි. ඊට ශානි අබේසේකර ඇතුළු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුහුණ දෙන හැටි ආණ්ඩුවද බලා සිටින බව පැහැදිලිය. රනිල් ආණ්ඩුව සමයේදී රට තුළ දැඩි ආන්දෝලනයට තුඩුදුන් වැලිගම ඩබ්ලිව් 15 හෝටලයට වෙඩිතැබීම ගැනද ආණ්ඩුවට තිබුණේ ලොකු උනන්දුවකි. ආණ්ඩුව ආ හැටියේම ඒ ගැන විමර්ශනද පැවරෙන්නේත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටය. පාර්ලිමේන්තුව තුළද මේ ගැන විමර්ශනයක් පැවැති අතර දේශබන්දු තෙන්නකෝන්ට පොලිස්පති පුටුව අහිමි වන්නේද එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

දේශපාලන වුවමනාවකට පොලිසිය ගැසූ ගේමක් ලෙස එම වෙඩිතැබීම මේ වනවිට විමර්ශන ඔස්සේ අනාවරණ වී හමාරය. දේශබන්දු ඇතුළු කොළඹ අපරාධ කොට්ඨාසයේ සේවයේ නිරතව සිටි පොලිස් නිලධාරීන් 08 දෙනෙක් අත්අඩංගුවට පවා ගන්නේ ඒ අනුවය. ඒ යැයි කියා තවමත් මේ ගේම පිටුපස සිටියේ යැයි කියන දේශපාලනඥයාට කිසිවක් සිදුව නැත.

අපේ ජනබල පක්ෂයේ මහලේකම් වේදිනිගම විමලතිස්ස හිමියන් පැහැරගෙන ගොස් උන්වහන්සේ බියගන්වා 2020 වසරේදී එම පක්ෂයට ලද ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය ලබාගැනීම සම්බන්ධයෙන් සැකපිට අතුරලියේ රතන හිමියන් අත්අඩංගුවට ගත්තේද වත්මන් ආණ්ඩුව බලයට ඒමෙන් අනතුරුවය. වේදිනිගම හිමියන් එහිදී දේශබන්දුගේ නමත් සමග වැලිගම සිදුවීමට නම කියැවෙන දේශපාලනඥයාගේ නමද කොළඹ අපරාධ කොට්ඨාසය හමුවේ කියා තිබුණි. වැලිගම සිදුවීමට මෙන්ම වේදිනිගම හිමියන්ගේ පැහැරගැනීම ගැනීමේ විමර්ශනයේදී පවා එකී දේශපාලනඥයාගෙන් අඩුම තරමින් ප්‍රකාශයක්වත් ලබාගැනීමට පොලිසිය අදටත් එඩිතර වී නැත.